# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/34 - 2010 ජුනි 03 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### ඌව පළාතේ පළාත් සභාව

ඌව පළාතේ පළාත් සභාවේ 2010 අංක ............ දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10 ක් ඉක්ම ගිය පසු ඌව පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 ක් තුළ දී එකී කරුණු මා වෙත දැනුම් දිය යුතු ය.

ජේ. එම්. බුද්ධදාස,<br>
ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා<br>
ළමාරක්ෂක කටයුතු හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 මැයි මස 08 වැනි දින,<br>
ඌව පළාතේ පළාත් සභාව,<br>
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා<br>
ළමා කටයුතු හා වනිතා කටයුතු අමාත්‍යංශයේ දී ය.

**ඌව පළාත් සභාවේ 2010 අංක ................ දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය**

***ඌව පළාතේ (බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල) ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය නගාසිටුවීම සහ සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය වන සේවා පහසුකම් විධිමත්ව පවත්වාගෙන යා හැකිවන පරිදි ඌව පළාත් සභාවේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් එයට සම්බන්ධ වූ අනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ ප්‍රඥප්තියකි***

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය "ඌව පළාත් සභාවේ 2009 අංක ......... දරන සෞඛ්‍ය සේවා ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ඌව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට හෝ නියම කරන පසු දිනක සිට ක්‍රියාත්මක වීම බලාත්මක වන්නේ ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

2.1 මෙම ප්‍රඥප්තියෙහි අඩංගු අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මතු දැක්වෙන විධිවිධාන අනුව (මින්මතු "දෙපාර්තමේන්තුව" යනුවෙන් හඳුන්වනු ලබන) ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවක් පිහිටවනු ලැබේ.

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම.

2.2. මෙම දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය වන කාර්ය මණ්ඩල පත්කිරීම, ස්ථාන මාරු කිරීම, විනය පාලනය පළාත් ආණ්ඩුකාරවරයා හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ වෙනත් බලධරයෙකු විසින් හෝ කළයුතු වන්නේ ය.

1A - PG 1149 — 360 (2010/06)

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය.

3. සෞඛ්‍ය විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් කරනු ලබන පොදු හෝ විශේෂ හෝ නියමයන්ට යටත්ව ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව ඌව පළාත තුළ –

(i) (ශික්ෂණ රෝහල් සහ විශේෂ කාර්ය සඳහා පිහිටුවනු ලබන රෝහල් හැර) ඌව පළාත තුළ දැනට පිහිටුවා ඇති හා මින් ඉදිරියට පිහිටුවනු ලබන පළාත් මහ රෝහල්, මූලික රෝහල්, දිස්ත්‍රික් රෝහල්, පර්යන්ත ඒකක, ග්‍රාමීය රෝහල්, මාතෘ නිවාස, මාතෘ නිවාස සමග පවත්වාගෙන යනු ලබන මධ්‍යම බෙහෙත් ශාලා, ශාඛා බෙහෙත් හල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන, වෛද්‍ය සායන හා විශේෂිත ඒකක ඇතුළුව සියලු ප්‍රතිකාර මධ්‍යස්ථාන අඛණ්ඩව පවත්වාගෙන යාම ;

(ii) මහජන සෞඛ්‍ය සේවා, පාසල් සෞඛ්‍ය සේවා, වැඩිහිටි සෞඛ්‍ය සේවා, සෞඛ්‍ය අධ්‍යාපනය, පවුල් සෞඛ්‍ය සේවා, මාතෘ දාරක රක්ෂණය, හා පෝෂණය ආහාර හා ආහාර සෞඛ්‍ය රක්ෂණය, පාරිසරික සෞඛ්‍ය යන කටයුතු සඳහා අවශ්‍ය වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල ඇතුළු රෝග නිවාරණ කටයුතු සඳහා වන සියලු ආයතන පිහිටුවීම සහ පවත්වාගෙන යාම ;

(iii) ඌව පළාත සඳහා සෞඛ්‍ය සංවර්ධන සැලැසුම් සහ වාර්ෂික සෞඛ්‍ය සැලසුම් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම හා හදිසි අවස්ථාවල දී පැන නගින සෞඛ්‍ය ගැටළු සඳහා සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම ;

(iv) ඌව පළාත තුළ ඉහත (i) හා (ii) වන ඡේදයන් හී සඳහන් වන ආයතන සඳහා යටිතල පහසුකම් ඇතුළු සියලු අවශ්‍යතා සැපයීම ;

(v) ඉහත (i), (ii) හා (iii) ඡේදයන් හී සඳහන් සේවාවන් සැපයීම සඳහා අවශ්‍යතාවය මත වරින් වර සේවක සංඛ්‍යාව තීරණය කිරීම හා ඒ සඳහා අදාළ බලධාරීන්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම හා සේවකයින් බඳවා ගැනීම සඳහා අවශ්‍ය පරිපාටි සකස් කිරීම ;

(vi) ඉහත (i) හා (ii) යටතේ වන ඌව පළාතේ සෞඛ්‍ය ආයතනවලට අනුයුක්ත පිරිස්වලට දේශීය හා විදේශීය පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා පහසුකම් සැපයීම

පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේ ය.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

4. රජයේ සෞඛ්‍ය අමාත්‍යවරයා යටතේ ඇති සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද එකඟත්වය මත ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන සේවයේ නිලධාරියෙකු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා (මින් මතු "අධ්‍යක්ෂ" වශයෙන් හඳුන්වනු ලබන) ලෙස පත් කළ යුතු අතර, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අධීක්ෂණය හා මෙහෙයවීම යටතේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කටයුතු කළ යුතු වන්නේ ය.

නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, වෛද්‍ය අධිකාරීන්, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, ප්‍රාදේශීය මැලේරියා වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් සහ අනෙකුත් නිලධරයන් පත් කිරීම.

5. මෙම ප්‍රඥප්තියේ කාර්යභාරයන් ඉටුකරලීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ සහායට මින් මතු අවශ්‍යතාවය අනුව නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, සහකාර ප්‍රාදේශීය සේවා අධ්‍යක්ෂවරුන්, වෛද්‍ය අධිකාරීන්, ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන්, ප්‍රාදේශීය මැලේරියා වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය නිලධාරීන් හා සෙසු නිලධරයන් ද පත්කරනු ලැබිය හැක්කේ ය.

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ බලතල ඔහු යටතේ වන නිලධාරීන් වෙත පවරාදිය හැකි බව.

6. මෙම ප්‍රඥප්තියෙහි විධිවිධාන සහ හෝ ඒ යටතේ පනවනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පවරා දී ඇති බලය මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන වෙනත් නිලධාරීන් හට ලියවිල්ලකින් පැවරීමට අධ්‍යක්ෂවරයාට හැක්කේ ය.

7. බදුල්ල හා මොණරාගල පරිපාලන දිස්ත්‍රික්ක වෙනුවෙන් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු පත් කරනු ලැබිය හැකි අතර, ඔවුන් එම දිස්ත්‍රික්කවල සෞඛ්‍ය සේවාවන් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳව ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාට වග කියනු ලැබිය යුතු ය. පරිපාලන දිස්ත්‍රික්ක සඳහා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු පත් කිරීම.

8. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙර ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු දරමින් සේවය කරනු ලැබූ සියලුම නිලධාරීන් හා සේවකයින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට මනාපය ප්‍රකාශ කිරීමෙන් පසුව මෙම ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබූවන් සේ සලකනු ලැබිය යුතු ය. දැනට සිටින සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මෙම ප්‍රඥප්තිය යටතේ පත්කරනු ලැබූවන් සේ සලකන බව.

9.1. මෙම ප්‍රඥප්තිය මගින් පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත පැවරෙන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් නියෝග/රෙගුලාසි පැනවිය හැකි වන්නේ ය. රෙගුලාසි පැනවිය හැකි බව.

9.2. මෙම වගන්තිය යටතේ පනවනු ලබන සෑම රෙගුලාසියක්/නියෝගයක් ම *ගැසට් පත්‍රයේ* පළකළ යුතු වන අතර, එය පළ වූ දින සිට හෝ එහි සඳහන් ඊට පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතු වන්නේය.

9.3. අමාත්‍යවරයා විසින් පනවනු ලබන රෙගුලාසි සහ නියෝග *ගැසට් පත්‍රයේ* පළවීමෙන් පසු මාස 03 ක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු වන්නේය. පළාත් සභාව විසින් එය අනුමත කළ පසු ඒ බව ද අනුමත නොකලේ නම් ඒ බව ද සඳහන් නිවේදනයක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතුය. එසේ පළ කිරීමේ දී එම නියෝගය යටතේ පෙර කරන ලද කාර්ය හා කර්තව්‍යයන්ට හානියක් නොවන පරිදි නියෝගය පරිච්චින්න වූවා සේ සැලකිය යුතු ය.

10.1. ඌව පළාත් සෞඛ්‍ය සේවා සැලසුම් සම්පාදනය හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා හට පොදුවේ උපදෙස් ලබාදීම සඳහා අමාත්‍යවරයා විසින් පළාත් සෞඛ්‍ය සේවා උපදේශක මණ්ඩලයක් පත්කළ යුතු ය. පළාත් සෞඛ්‍ය සේවා උපදේශක මණ්ඩලය.

10.2. පළාත් සෞඛ්‍ය සේවා උපදේශක මණ්ඩලයේ (මින් මතු ''උපදේශක මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන) සාමාජික සංඛ්‍යාව 15 කට නොවැඩි විය යුතු අතර, පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය :–

I. ඌව පළාත් සෞඛ්‍ය ලේකම්
II. ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
III. ඌව පළාත් ආයුර්වේද කොමසාරිස්
IV. ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
V. ඌව පළාත් පාලන කොමසාරිස්
VI. ඌව පළාත් සමාජ සේවා අධ්‍යක්ෂ
VII. බදුල්ල/මොණරාගල දිස්ත්‍රික් භාර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්
VIII. රාජ්‍ය අංශයේ සේවයේ නොයෙදෙන රජයේ වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන් දෙදෙනෙකු (දිස්ත්‍රික්ක දෙක නියෝජනය වන පරිදි)
IX. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි සෞඛ්‍ය හා සමාජ සේවා කටයුතු යටතේ නිරත ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන ස්වෙච්ඡා සංවිධානවල දෙදෙනෙක්
X. සෞඛ්‍ය සේවයේ නියුතු වෘත්තීය සමිති නියෝජිතයින් තිදෙනෙකු (මෙම නියෝජනය අතුරු වෛද්‍ය සේවය, හෙද හා කණිෂ්ඨ වෘත්තීය කේෂ්ත්‍ර අදාළ සේවා විය යුතු ය.).

10.3. පළාත් සෞඛ්‍ය ලේකම් උපදේශක මණ්ඩලයේ සභාපති විය යුතු අතර, පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයා එහි ලේකම් ලෙස කටයුතු කළ යුතු ය.

10.4. මෙහි (I) සිට (VII) දක්වා වන සාමාජිකයින් නිලබලයෙන් පත්විය යුතු අතර, (VIII) සිට (X) දක්වා සාමාජිකයින් පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් පත් කළ යුතුය. අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් ඕනෑම අවස්ථාවක ඉවත් කිරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේ ය.

10.5. උපදේශක මණ්ඩලයේ ධූර කාලය අවුරුදු 03 ක් වනු ඇත.

10.6. උපදේශක මණ්ඩල රැස්වීම සඳහා ගණපූර්ණය 8 ක් වන අතර, අවම වශයෙන් මාස 03 කට වරක් රැස්විය යුත්තේ ය.

10.7. නිල බලයෙන් පත්වන සෑම සාමාජිකයකුගේම ධූර කාලය උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු වීමට ඔහු/ඇය තමන් දරන තනතුරෙහි සිටිනතාක් කල් පමණක් වන්නේ ය.

**සාමාජිකත්වය සඳහා සුදුසුකම්.**

10.8. ඉල්ලා අස්වීම, මිය යාම හෝ අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකාරයකින් කලින් ධූරය හිස් වුවහොත් මිස පත් කරනු ලබන සෑම සාමාජිකයෙකුටම ඔහු/ඇය පත් කරනු ලබන දින සිට අවුරුදු 03 කාලයක් සාමාජික ධූරය දැරිය හැකි අතර, නැවත පත් කිරීමට නුසුදුස්සෙකු නොවන්නේ ය.

10.9. පත් කළ සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධූරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධූරය හිස්වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් එම සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයෙකු වශයෙන් වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය යුත්තේය. එසේ පත් කරනු ලබන සාමාජිකයා තම පූර්වගාමියාගේ ඉතිරි ධූර කාලය සඳහා පමණක් සිය ධූරය දැරිය යුතු වන්නේ ය.

**දීමනාවක් ගෙවීම.**

10.10. උපදේශක මණ්ඩල රැස්වීම් වාරයකට සහභාගි වන සාමාජිකයකු හට ඒ වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබිය හැකි අතර, එකී දීමනාව පළාත් ආණ්ඩුකාරවරයාගේ එකඟත්වය මත පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන්නේ ය.

**උපදේශක මණ්ඩලයේ කාර්යයන්.**

10.11. පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් උපදේශක මණ්ඩලය වෙත යොමු කර තීරණයක් ගත යුතු යැයි අදහස් කරන පොදු ප්‍රතිපත්ති කරුණු සම්බන්ධයෙන් හා පළාත් සෞඛ්‍ය සංවර්ධන සැලැස්මට අදාළ වන පළාතේ සෞඛ්‍ය අවශ්‍යතා හඳුනාගෙන පළාතේ සෞඛ්‍ය සංවර්ධනය සඳහා වූ යෝජනා ඉදිරිපත් කිරීම උපදේශක මණ්ඩලයේ කාර්යභාරය වන්නේ ය.

**සෞඛ්‍ය ආයතන ඇති කිරීම හා සෞඛ්‍ය කොට්ඨාශ ප්‍රතිසංවිධානය කිරීම.**

11. ඌව පළාත තුළ ජනගහන ව්‍යාප්තිය, භූමි ප්‍රමාණය, රෝග ව්‍යාප්තිය, පෝෂණ තත්ත්වය, පාරිසරික බලපෑම් සහ ගමනා ගමන පහසුකම් ආදිය පදනම් කර ගනිමින් ස්ථිර හෝ තාවකාලිකව නව සෞඛ්‍ය ආයතන ආරම්භ කිරීම, සෞඛ්‍ය පරිපාලන කොට්ඨාශ ප්‍රතිසංවිධානය කිරීම ආදිය සම්බන්ධයෙන් පළාත් අධ්‍යක්ෂවරයා විසින් අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කළ යුතු අතර, ලේකම්වරයා විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව ක්‍රියාත්මක කළ යුතු වන්නේ ය.

**සෞඛ්‍ය ආයතන පරීක්ෂා කිරීමේ බලය.**

12. සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා විසින් හෝ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් හෝ නිසි පරිදි බලය පවරනු ලැබූ ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ හෝ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෝ නිලධාරියෙකු විසින් ඌව පළාත තුළ පිහිටි ඕනෑම සෞඛ්‍ය ආයතනයකට හෝ මහජන සෞඛ්‍ය අවශ්‍යතා සඳහා අවශ්‍ය වෙතැයි අදහස් කරන ඕනෑම ආයතනයකට හෝ එම ආයතන පිහිටි භූමියකට හෝ ඇතුළුවීම හෝ පරීක්ෂාවට භාජනය කිරීම, එය ආයතනයේ සේවයේ යෙදී සිටින පුද්ගලයින්ගෙන් හෝ සේවය ලබා ගැනීමට පැමිණි පුද්ගලයින්ගෙන් හෝ ප්‍රකාශ ලබා ගැනීම, තොරතුරු, ඡායාරූප හෝ ලියකියවිලි හෝ ඒවායේ පිටපත් ලබා ගැනීම හෝ කළ හැකි වන්නේ ය.

**චංචල හා නිශ්චල දේපළවල භාරකාරත්වය.**

13. දැනට ඌව පළාත තුළ ඇති සියලු සෞඛ්‍ය ආයතන සහ ඊට අදාළ චංචල හා නිශ්චල වත්කම්/දේපළ සියල්ල ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව වෙත පවරනු ලැබූවා සේ සැලකිය යුතු වන්නේ ය.

**වාර්ෂික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම.**

14.1. ඌව පළාත තුළ පිහිටි භූමි ප්‍රමාණයට සාපේක්ෂ ජනගහන ව්‍යාප්තිය, රෝග පැතිරීම, පෝෂණ තත්ත්වය වැනි පාරිසරික බලපෑම්, ගමනාගමන පහසුකම් හා වෙනත් සෞඛ්‍යමය නිර්නායකයන් පදනම් කරගත් සෑම ඉදිරි වර්ෂයක් සඳහා වූ පළාත් සෞඛ්‍ය සංවර්ධන සැලැස්මක් සෑම වසරකම සැප්තැම්බර් මස 30 වැනි දිනට ප්‍රථම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් සකස් කොට තම නිර්දේශය ඇතුළත් කර සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම වාර්ෂික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම සඳහා උපදේශක මණ්ඩලයේ එකගතාවය ද ලබා ගත යුතු වන්නේ ය.

14.2. ඌව පළාත තුළ සියලුම සෞඛ්‍ය ආයතනවලට අදාළ සංවර්ධන කටයුතු හා නව ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු මෙම සැලැස්මට ඇතුළත් විය යුතු යුතු ය.

**පළාත් සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ වාර්ෂික වාර්තාව.**

15. වාර්ෂික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමෙන් පසු එහි ප්‍රගතිය පිළිබඳව සංඛ්‍යාත්මක විස්තර ද ඒවා පිළිබඳ තම නිගමන හා නිර්දේශයන් ද ඇතුළත් සවිස්තර වාර්තාවක් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් සෑම වර්ෂයකම මුල් කාර්තුවේ දී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

16. ඌව පළාත තුළ ඇති පළාත් පාලන බල ප්‍රදේශවල සෞඛ්‍ය තත්වය පිළිබඳව සොයා බලා අවශ්‍ය සෞඛ්‍ය සේවා කටයුතු ක්‍රියාත්මක කිරීමට පළාත් අධ්‍යක්ෂවරයාට බලය ඇති අතර, එම ප්‍රදේශ තුළ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත තොරතුරු අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කරන ලෙසට පළාත් පාලන බලධාරීන් වෙත දැනුම් දීමට හැකි අතර පළාත් පාලන බලධාරීන් විසින් ඒ අනුව කටයුතු කළ යුතු වන්නේය. පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ සෞඛ්‍ය කටයුතු.

17. රෝගී සත්කාරක සේවාවන් පවත්වාගෙන යාමේදී රෝහලක නේවාසිකව සිටින රෝගීන්ට හා එහි සේවකයින්ට පිසූ ආහාර සැපයීම පළාත් අධ්‍යක්ෂවරයා සතු වගකීමකි. එසේ ආහාර සැපයීමේදී ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීමක් මගින් සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගනිමින් හෝ විවෘත ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව ටෙන්ඩර් ලබා ගැනීමට සුදුසුකම් ලත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් ආයතන මගින් හෝ නීත්‍යානුකූලව පිහිටුවා ගන්නා ලද රෝහල් කමිටුවක් මගින් හෝ පිසූ ආහාර සපයා ගැනීමට හෝ සමූපකාර සමිතියක් වෙතින් අමු ආහාර මිල දී ගෙන රෝහල් කාර්ය මණ්ඩලය ලවා හෝ රෝහල් කමිටුව ලවා හෝ එම ආහාර පිස ගැනීමෙන් හෝ මෙම සේවාව ලබා දීමට අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය. පිසූ ආහාර සැපයීම.

17.1. මෙම ප්‍රඥප්තිය යටතේ පළාතේ ඖෂධ වෙළඳසැල් ෆාමසි පරීක්ෂා කිරීම හා පාලනය කිරීමට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔවුන් බලය පවරන ලද නිලධාරියෙකුට හැකියාව ඇත්තේ ය.

17.2. ඒ අනුව මහජනයාට යම් අක්‍රමිකතාවයන් සිදු වන්නේදැයි හැඟී යන්නේ නම් නඩු පැවරීමට ද මෙම ප්‍රඥප්තිය යටතේ හැකියාව ලබන්නේ ය.

18.1. ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය වන මුදල් ප්‍රතිපාදන පළාත් සභාවේ වාර්ෂික අය වැය ප්‍රකාශය මගින් හා වෙනත් විදේශාධාර ව්‍යාපෘති වලින් ද අවශ්‍ය විටෙක ඉදිරිපත් කරනු ලබන පරිපූරක ඇස්තමේන්තු වලින් ද ලබාදෙනු ඇත. මුදල් ප්‍රතිපාදන හා විගණනය.

18.2. මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු විගණකාධිපතිවරයාගේ ද, ප්‍රධාන ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන ඒකකයේ ද, පළාත් අමාත්‍යාංශයේ ද විගණනයට යටත් වන්නේ ය.

19.1. ඌව පළාත තුළ පිහිටි (පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට ගැනෙන) මහ රෝහල්, මූලික රෝහල්, දිසා රෝහල්, පර්යන්ත ඒකක හා ග්‍රාමීය රෝහල්වල සංවර්ධනය හා පුනරුත්ථාපන කටයුතු සඳහා මහජනතාවගේ සහභාගිත්වය ලබා ගැනීම සඳහාත් ඒවායේ කටයුතු අධීක්ෂණයට ලක් කිරීම සඳහාත් පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත වූ (මින් මතු ''රෝහල් කමිටු'' යනුවෙන් හඳුන්වනු ලබන) කමිටුවක් පළාත් සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පළාත් සෞඛ්‍ය ලේකම්වරයා විසින් පත් කළ හැක්කේය. මෙහි සාමාජික සංඛ්‍යාව උපරිම 25 කට සීමා වේ :– රෝහල් සංවර්ධන කමිටු පිහිටුවීම හා එහි සංයුතිය.

I. ආයතනය භාර වෛද්‍ය නිලධාරි
II. රෝහල පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් හෝ නියෝජිතයෙකු
III. රෝහල පිහිටි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ නියෝජිතයෙකු
IV. රෝහල පිහිටි බල ප්‍රදේශයට අදාළ ප්‍රාදේශීය ඉංජිනේරු (ගොඩනැගිලි) හෝ නියෝජිතයෙකු
V. රෝහල පිහිටි පොලිස් බල ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපති
VI. රෝහල පිහිටි ප්‍රදේශයේ විදුහල්පතිවරුන්
VII. රෝහල් සේවක මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකු
VIII. පූජ්‍ය පක්ෂයේ නියෝජිතයන්
IX. ප්‍රාදේශීය ප්‍රභූ පුද්ගලයින් දෙදෙනෙකු
X. ප්‍රාදේශීය ප්‍රජා සංවිධානවල නියෝජිතයින් දෙදෙනෙක්
XI. රෝහල පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයන් දෙදෙනෙක්

19.2. ආයතන භාර වෛද්‍යවරයා, නිල බලයෙන් කමිටුවේ සභාපති ධූරය දැරිය යුතු වන්නේය. සුදුසු ලේකම්වරයෙකු, ආරම්භක සභා රැස්වීමේදී තෝරා ගත යුතු යි.

රෝහල් කමිටුවේ වගකීම.

19.3. (I) මධ්‍යම රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික නිර්නායකයන්ට අනුකූලව පළාත් අමාත්‍යාංශය විසින් දෙනු ලබන නියමයන් හා උපදෙස්වලට යටත්ව සෞඛ්‍ය ආයතනයේ සංවර්ධනය හා මනා කළමනාකාරීත්වයකින් යුතු කාර්යක්ෂම රෝහල් සේවාවක් ජනතාවට ලබාදීම රෝහල් කමිටුවේ මූලික වගකීම වන්නේ ය.

(II) රෝහල් සංවර්ධන කාර්යයේදී ඉදිකිරීම් හෝ අලුත්වැඩියා හෝ සේවා සැපයීම් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව මෙම කමිටුව වෙත පැවරීමට ලේකම්වරයාට බලය ඇත. එහිදී මධ්‍යම රජය විසින් පනවා ඇති හෝ මතුවට පනවනු ලබන මූල්‍ය සීමාවන් අදාළ කරගත යුතු ය.

19.4. කමිටුවේ නිල කාලය වසර 02 ක් විය යුතු වේ.

19.5. දැනටමත් ක්‍රියාත්මකව ඇති රෝහල් කමිටු මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද්දා වූ රෝහල් කමිටු ලෙස සැළකිය යුතු වන්නේ ය.

කමිටු ව්‍යවස්ථාව.

20. කමිටුවේ පරිපාලනය සඳහා සුදුසු ව්‍යවස්ථාවක් අමාත්‍යවරයා විසින් නියෝග පැනවීම මගින් සකස් කර දිය හැකිය.

අර්ථ නිරූපණය.

21. (I) ''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා අදහස් කෙරේ.

(II) ''අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයා අදහස් කෙරේ. පළාත් සභාව විසුරුවා හැරුණු අවස්ථාවක ''ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයා යන්නෙන් ඌව පළාත් ගරු ආණ්ඩුකාරවරයා'' අදහස් කෙරේ.

(III) ''ලේකම්වරයා'' යන්නෙන් ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් කෙරේ.

(IV) ''අධ්‍යක්ෂවරයා'' යන්නෙන් ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව භාර ප්‍රධානියා අදහස් කෙරේ.

(V) ''දෙපාර්තමේන්තුව'' යන්නෙන් ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව අදහස් කෙරේ.

(VI) ''පළාත'' යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ දක්වා ඇති ඌව පළාත් බල ප්‍රදේශය අදහස් කෙරේ.

(VII) ''පළාත් සභාව'' යන්නෙන් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක දෙක අයත් වූ ඌව පළාත සඳහා පිහිටුවා ගන්නා ලද පළාත් සභාව අදහස් වේ.

(VIII) ''ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරු'' යන්නෙන් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල සෞඛ්‍ය කටයුතු භාර දිස්ත්‍රික් ප්‍රධානීන් අදහස් කෙරේ.

වචනාර්ථ.

22. මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

06-337/1

---

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් සභාවේ 2010 අංක ............. දරන ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10 ක් ඉක්ම ගිය පසු ඌව පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 ක් තුළ දී එකී කරුණු මා වෙත දැනුම් දිය යුතුය.

ඒ. එම්. බුද්ධදාස,
ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා
ළමාරක්ෂක කටයුතු හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 මැයි මස 08 වැනි දින,
ඌව පළාතේ පළාත් සභාවේ,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා
ළමා කටයුතු හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ දී ය.

## ඌව පළාත් සභාවේ 2010 අංක ................ දරන ඌව පළාත් ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය

*ඌව පළාතේ ජනතාවගේ නිරෝගීභාවය උදෙසා දේශීය ආයුර්වේද, සිද්ධ හා යුනානි යන වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා ව්‍යාප්ත කරලීම සඳහා ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, එයට අදාළ කාර්ය මණ්ඩල බඳවා ගැනීමත්, ආයුර්වේද රෝහල් ඇතුළු අනුබද්ධිත ආයුර්වේද ආයතන පිහිටුවීම හා ඒවා කාර්යක්ෂම ලෙස පවත්වාගෙන යාම සඳහා, රෝහල් කමිටු, පුහුණු කළමනාකරණ මණ්ඩලයක්, ආයුර්වේද සංරක්ෂණ සභා හා උපදේශක සභා පිහිටුවීමත් ඒවා මැනවින් පවත්වාගෙන යාමත් එයට අනුෂාංගික වෙනත් කරුණු ඉටුකරගැනීම සඳහාත් වූ විධිවිධාන සැලැස්වීම සඳහා පනවනු ලබන ප්‍රඥප්තියකි*

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 09 වැනි උපලේඛනයේ 12 වැනි වගන්තියෙන් පළාත් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් සභාවේ 2009 අංක ................... දරන ආයුර්වේද හා දේශීය වෛද්‍ය සේවා ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනක සිට හෝ නියම කරන පසු දිනක සිට ක්‍රියාත්මක වන්නේ ය. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.)*

2.1. මෙහි මතු දැක්වෙන පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා (මෙහි මින්මතු දෙපාර්තමේන්තුව වශයෙන් හැඳින්වෙන) ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබේ. *(පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීම.)*

2.2. ඌව පළාත් සභාව විසින් වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ට යටත් ව පහත සඳහන් පරමාර්ථ හා අරමුණු ඉෂ්ඨ කිරීම සඳහා දෙපාර්තමේන්තුව කටයුතු කළ යුතුය. එනම්, *(පරමාර්ථ හා අරමුණු.)*

(අ) ජනතාවගේ නිරෝගීභාවය උදෙසා සෞඛ්‍ය ආරක්ෂාව හා ප්‍රවර්ධනයත් ප්‍රතිකාර පහසුකම් සැලසීමත් සහ ප්‍රාථමික සෞඛ්‍ය සංවර්ධනය සඳහා ද අවශ්‍ය ආයතන ඇති කිරීම, හා සේවාවන් සැපයීම ;

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන ඒකක පිහිටුවීමට අවශ්‍ය පහසුකම් සැලසීම ;

(ඇ) ආයුර්වේදයට අනුව රෝග පරීක්ෂා කිරීම හා මහජන සෞඛ්‍ය සංවර්ධනය සඳහා කටයුතු කිරීම ඊට ධෛර්යය දීම ;

(ඈ) දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත හෝ සේවයෙහි යෙදවීමට යෝජිත තැනැත්තන්ට ශිෂ්‍යත්ව හා වෙනත් පහසුකම් ප්‍රදානය කිරීමෙන් ද, ආයුර්වේදය සම්බන්ධයෙන් පාඨමාලා සපයනු ලබන හෝ පර්යේෂණ කටයුතුවල යෙදෙන ආයතනවලට මුදල් ආධාර හා වෙනත් උදව් ප්‍රදානය කිරීමෙන්ද, ආයුර්වේදය ඉගෙනීම හා ඒ සම්බන්ධ පර්යේෂණ කටයුතුවලට ධෛර්යය දීම ;

(ඉ) පාරම්පරික හා දේශීය වෛද්‍ය ක්‍රම සංරක්ෂණය, සංවර්ධනය හා ඒවායේ තත්ත්වය වැඩිදියුණු කිරීම ;

(ඊ) ඌව පළාතට ආවේනික වූ පාරම්පරික වෛද්‍ය දැනුම, පුස්කොළ පොත් හා වෛද්‍ය උපකරණ සුරක්ෂිත කිරීම පිණිස, පළාත් ආයුර්වේද කෞතුකාගාරයක් පිහිටුවීම හා පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් සැලසීම ;

(එ) පළාත තුළ ඔසු උයන් හා තවාන් පවත්වාගෙන යාම, නඩත්තුව හා අවශ්‍ය පහසුකම් සැලසීම හා ඒ යටතේ ස්වයං රැකියා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට පෙළඹවීම ;

(ඒ) පළාතට අවශ්‍ය නිමි ඖෂධ පළාත තුළ නිෂ්පාදනය කිරීම සඳහා පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයක් පිහිටුවීම ;

(උ) සංචාරක කර්මාන්තය හා සම්බන්ධ වෙමින් දේශීය වෛද්‍ය ක්‍රම ප්‍රචලිත කිරීමට හා ආදායම් උත්පාදන ක්‍රම බිහිකිරීම ;

(ඌ) අන්තරායකාරී ඖෂධ මිල දී ගැනීමට අවශ්‍ය සම්බන්ධීකරණය සඳහා සහය වීම.

3.1. මෙම ප්‍රඥප්තියේ සඳහන් පරමාර්ථ හා අරමුණුවලට අදාළව පිහිටුවනු ලබන ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කිරීම සඳහා පළාත් ආයුර්වේද කොමසාරිස්වරයෙකු පත් කළ යුතු ය. *(පළාත් ආයුර්වේද කොමසාරිස්.)*

3.2. පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා ශ්‍රී ලංකා ආයුර්වේද සේවයේ වෛද්‍ය නිලධාරියෙකු විය යුතු අතර, ඔහු 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වැනි වගන්තියට අදාළව ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කළ යුතු වන්නේ ය.

3.3. පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා ඌව පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝග හා මෙහෙයවීම යටතේ කටයුතු ඉටුකළ යුතු ය.

වෙනත් නිලධාරීන් හා සේවකයින් පත් කිරීම.

4.1. පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාට තම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටුකරලීම සඳහා අවශ්‍ය වෙතැයි හැගෙන අනුමත කාර්ය මණ්ඩලයට අයත් වන, අවශ්‍ය වන නියෝජ්‍ය හා සහකාර ආයුර්වේද කොමසාරිස්වරුන් ඇතුළු වෙනත් නිලධරයන් ද ආයුර්වේද වැඩසටහන් සහකාරවරුන් ද ඌව පළාත් ආණ්ඩුකාරයා විසින් හෝ ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් හෝ පත් කළ යුත්තේ ය.

4.2. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට පෙරාතුව ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු දරමින් සේවය කරනු ලැබූ සියලු ම නිලධරයන් හා සේවකයින් පළාත් රාජ්‍ය සේවයේ සේවය කිරීමට සිය මනාපය ප්‍රකාශ කිරීමෙන් පසුව මෙම ප්‍රඥප්තිය යටතේ පත් කරනු ලැබූවන් සේ සලකනු ලැබිය යුත්තේ ය.

4.3. මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පත් කරනු ලබන සියලු ම නිලධරයන් හා සේවකයින් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වැනි වගන්තිය යටතේ අර්ථානුකූල පළාත් රාජ්‍ය සේවකයින් ලෙස සලකනු ලබනු යුත්තේ ය.

ආයුර්වේද කොමසාරිස්ගේ බලතල හා කාර්යයන්.

5. මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරනු ලබන ව්‍යවස්ථාපිත, ආයතනවලින් එළඹෙන අවසාන නිර්දේශයට යටත්ව ආයුර්වේද කොමසාරිස්වරයාට පහත සඳහන් බලතල ඇත්තේ ය :—

(අ) 2.2 වගන්තියෙහි නියමිත පරමාර්ථ ඉෂ්ඨ කිරීමේදී කොමසාරිස්වරයා විසින්, ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ නිධි, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, ආයුර්වේද බෙහෙත් ගබඩා, ඔසු උයන් සහ පැළ තවාන්, ආයුර්වේද කෞතුකාගාරයක් සහ ආයුර්වේද ඖෂධ වෙළඳ සැල් හා පළාත්, දිස්ත්‍රික්, ප්‍රාදේශීය, දේශීය වෛද්‍ය හා ආයුර්වේද සංරක්ෂණ සභා පිහිටුවා පවත්වාගෙන යාම හෝ පිහිටුවා පවත්වාගෙන යාමට සැලැස්වීම හෝ ඊට ආධාර අනුබල දීම ;

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ස්ථාපිත කරනු ලබන ආයතන මගින් එළඹෙන තීරණ එකී ආයතනවල නිර්දේශයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම ;

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරනු ලබන ආයතනයන්හි දත්ත හා සංඛ්‍යා ලේඛන ක්‍රමානුකූලව හා යාවත්කාලීනව පවත්වාගෙන යාම ;

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ඇති සියලුම ව්‍යවස්ථාපිත ආයතන උසස් තත්වයේ ප්‍රමිතියෙන් හා තත්කාලීන නිර්දේශයන්ට අනුව පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කර බලා ඒ පිළිබඳ ඇමතිවරයාට සහ අදාළ ව්‍යවස්ථාපිත ආයතනවලට කලින් කලට වාර්තා ඉදිරිපත් කිරීම ;

(ඉ) පළාත් ආයුර්වේද ඖෂධ පාලක මණ්ඩලය විසින් පාලනය කරනු ලබන ආයුර්වේද ආයතන එම මණ්ඩලයේ නිර්දේශයට අනුව ලියාපදිංචි කිරීම සහ සහතික නිකුත් කිරීම.

උපදේශක මණ්ඩලයක් පිහිටුවීම.

6. මෙම ප්‍රඥප්තියේ අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා විෂය භාර අමාත්‍යවරයාට උපදෙස් දෙනු පිණිස උපදේශක මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතුය. එම උපදේශක මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, එහි සංයුතිය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා,

(ආ) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා,

(ඇ) පළාත් දේශීය වෛද්‍ය විෂය භාර ගරු අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයෙක්,

(ඈ) පරිපාලන සේවයේ හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශ්‍රාමලත් විධායක නිලධාරියෙක්,

(ඉ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක්,

(ඊ) ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන ආචාර්ය මණ්ඩලයේ නියෝජිතයෙක්,

(උ) බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කයන් නියෝජනය කිරීම සඳහා ආයුර්වේද සංරක්ෂණ සභා බල මණ්ඩලවල සාමාජිකයන් දෙදෙනෙකු.

7. 2.2 වගන්තියේ නියමිත පරමාර්ථ ඉෂ්ඨ කිරීමේදී පාර්ලිමේන්තුව හා පළාත් සභාව විසින් ඒ සඳහා සම්මත කරන ලද මුදල් හා ප්‍රතිපාදන වලින් යම් ප්‍රමාණයක් ඇමතිවරයාගේ පූර්ණ අනුමැතිය ඇතිව කොමසාරිස්වරයා විසින් — කොමසාරිස්වරයා විසින් දෙනු ලබන මුදල් ආධාර.

(අ) පළාත් ආයුර්වේද අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලයට

(ආ) පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලයට

(ඇ) පළාතේ ආයුර්වේද ඖෂධ පාලක මණ්ඩලයට

(ඈ) ආයුර්වේද දියුණු කිරීම සහ සංරක්ෂණය සඳහා පිහිටුවා පවත්වාගෙන යනු ලබන වෙනයම් ආයතනයකට

(ඉ) ආයුර්වේද අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා වෙනයම් සුදුසු තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ද,

(ඊ) පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභා සඳහා ද

ප්‍රදානය කළ හැකිය.

8.1 යම් ස්ථානයක දැනට ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ නිධියක්, ඔසු උයනක්, ආයුර්වේද බෙහෙත් ගබඩාවක් හෝ ආයුර්වේද බෙහෙත් වෙළඳ සැලක් වශයෙන් කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබ, ඒ ස්ථානයෙහි ඒ ආරෝග්‍යශාලාව, ඖෂධ නිෂ්පාදනාගාරය, ඖෂධ නිධිය, ප්‍රතිකාර මධ්‍යස්ථානය, බෙහෙත් ශාඛාව හෝ බෙහෙත් වෙළඳසැල, ආයුර්වේද සත්කාරක මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන තැනැත්තා එහි අයිතිකරු වශයෙන් කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබුවහොත් මිස, ඇමතිවරයා විසින් ඒ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ නියෝගයකින් නියම කළ හැකි දිනයක පටන් හා ඊට පසු ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ නිධියක්, ආයුර්වේද බෙහෙත් වෙළඳසැලක් හා ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානයක් සඳහා කිසිම ස්ථානයක් පරිහරණය නොකළ යුතු ය. ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ නිධි, ඔසු උයන් ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, ආයුර්වේද බෙහෙත් ගබඩා, ආයුර්වේද බෙහෙත් වෙළඳසැල් සහ ආයුර්වේද සත්කාරක මධ්‍යස්ථාන ලියාපදිංචි කළ යුතු බව.

8.2. (1) වැනි උප වගන්තිය යටතේ ප්‍රසිද්ධ කරනු ලැබූ නියෝගයකින් නියමිත දිනය ඒ අනුව ප්‍රසිද්ධ කිරීමේ දින සිට තුන් මාසයකට මෙපිට දිනයක් නොවිය යුතු ය.

8.3. මෙහි 8.1 උප වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් ආයුර්වේද ආරෝග්‍යශාලාවක, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක, ආයුර්වේද ඖෂධ නිධියක, ඔසු උයනක, ආයුර්වේද බෙහෙත් ගබඩාවක හෝ ආයුර්වේද බෙහෙත් වෙළඳසැලක, ආයුර්වේද සත්කාරක මධ්‍යස්ථානයක කාර්යය සඳහා යම් ස්ථානයක් පාවිච්චි කරනු ලබන අවස්ථාවක ඒ ආරෝග්‍යශාලාව, ඒ ඖෂධ නිෂ්පාදනාගාරය, ඒ ඖෂධ නිධිය, ඒ ප්‍රතිකාර මධ්‍යස්ථානය, ඒ ඖෂධ උද්‍යානය, ඒ බෙහෙත් ගබඩාව හෝ ඒ බෙහෙත් වෙළඳසැල, ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානය අයිතිකරු හෝ භාරව සිටින තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරනු ලබන්නේය. එවැන්නෙකුට එරෙහිව මෙම ප්‍රඥප්තිය යටතේ නඩු පැවරීමට හැකි වන්නේ ය.

9. පහත සඳහන් එක් කරුණක් හෝ සියල්ලම හෝ සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තිය යටතෙහි අමාත්‍යවරයාට නියෝග සම්පාදනය කළ හැකියි :— අමාත්‍යවරයාට රෙගුලාසි පැනවිය හැකි බව.

(අ) ආයුර්වේද ආරෝග්‍යශාලාවක්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානයක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ නිධියක්, ඔසු උයනක්, ආයුර්වේද බෙහෙත් ගබඩාවක් හෝ ආයුර්වේද බෙහෙත් වෙළඳ සැලක්, ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානයක් වශයෙන් යම් ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීම.

(ආ) එම ඉල්ලුම්පත්‍රවල ආකෘතිය හා ඒවායේ අන්තර්ගත විය යුතු විස්තර.

(ඇ) ඒ ලියාපදිංචි කිරීම වලංගු විය යුතු කාලසීමාව හා නියමිත ගාස්තුව ගෙවීමෙන් පසු ඒ ලියාපදිංචිය අලුත් කිරීම සම්බන්ධයෙන් සහතික ප්‍රදානය කිරීම.

(ඈ) එම ලියාපදිංචි කිරීම අලුත් කිරීම, ප්‍රතික්ෂේප කළ හැකි අවස්ථා.

(ඉ) එම ලියාපදිංචි කිරීම සඳහා හෝ ලියාපදිංචි කිරීම අලුත් කිරීම සඳහා හෝ ඉදිරිපත් කරනු ලැබූ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව හෝ ලියාපදිංචි කිරීම අවලංගු කිරීමට විරුද්ධව ඇමතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනා පිළිබඳව ඇමතිවරයා විසින් දෙනු ලබන තීරණයන්හී, අවසාන භාවය සම්බන්ධයෙන්.

(ඊ) ලියාපදිංචි කරනු ලැබූ ආයුර්වේද ආරෝග්‍යශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ නිධි, ඔසු උයන්, ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථාන, ආයුර්වේද බෙහෙත් ගබඩා හෝ ආයුර්වේද වෙළඳසැල්, ආයුර්වේද සත්කාර මධ්‍යස්ථානයක් සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නියමයන් සහ කොන්දේසි.

(උ) ඒවා මගින් පවත්වාගෙන යා යුතු වාර්තා හා බැංකු වාර්තා හා පොත්පත්.

(ඌ) අදාළ ආයතන සම්බන්ධයෙන් කලින් කළ සැපයිය යුතු වාර්තා හා ඒවාට ඇතුළත් කළ හෝ ඒවායින් ප්‍රතිකාර ගනු ලැබූ රෝගීන්ගේ සංඛ්‍යා විස්තර සහ ඒවායේ නියුතු කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර ඇතුළුව එකී වාර්තාවල අඩංගු විය යුතු විස්තර.

(එ) අදාළ ආයතන මගින් අයකර ගත හැකි ගාස්තු හෝ අයකිරීම් සම්බන්ධ නියමයන්.

(ඒ) එම ආයතනවලට ඇතුළුවීම හා පරීක්ෂා කිරීම සම්බන්ධ බලතල.

(ඔ) අදාළ මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීමේ කාර්යය සහ කොමසාරිස්වරයා විසින් තැබිය යුතු හා පවත්වාගෙන යා යුතු ලේඛන හා පවත්වාගෙන යා යුතු ලේඛන හා

(ඕ) එකී ආයතනවල ප්‍රතිකාර ගනු ලබන තැනැත්තන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව හා ඔවුනට නිසියාකාරව සැලකීම හා ප්‍රතිකාර කිරීම සහ සේවා පහසුකම්.

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා.

10. ඌව පළාතේ, පළාත් පාලන දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවල රෝගීන්ට ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන ඖෂධ වලින් යම් ප්‍රමාණයක් ඌව පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයේ නිෂ්පාදිත ඖෂධ අතුරින් සපයනු ලැබිය හැකිය.

පළාත් ආයුර්වේද ගිණුමක්.

11.1. 2.2 වගන්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා හා මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රෙගුලාසි තුළින් ප්‍රකාශ කරනු ලබන අරමුණු සපුරා ගැනීම සඳහා පළාත් ආයුර්වේද ගිණුමක් (මින් මතු ''ආයුර්වේද ගිණුම'' ලෙස හඳුන්වන) ඇති කළ යුතු ය.

11.2. ගිණුමේ ආරම්භක දායකත්වය වශයෙන් රු. 5,00,000 ක මුදලක් පළාත් සභා අය වැය ලේඛනයෙන් ප්‍රතිපාදනය කොට ගිණුම ආරම්භ කළ යුතු ය.

11.3. 7 වැනි වගන්තියේ සඳහන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන පළාත් සභා අරමුදල තුළින් මෙම ආයුර්වේද ගිණුමට බැර විය යුතු අතර, ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා මෙම ගිණුමේ මුදල් භාවිත කළ හැකිය.

ගිණුමට මුදල් ලැබෙන වෙනත් ප්‍රභවයන්.

11.4. ඉහත 11.2 හා 11.3 වගන්තීන් හි සඳහන් ප්‍රතිපාදනවලට අමතරව පළාත් පාලන ආයතනවලට සපයනු ලබන ඖෂධ වෙනුවෙන් වැයවන මුදල් පියවා ගැනීම සඳහා පළාත් පාලන ආයතනයන්හි වාර්ෂික ආදායමෙන් කොටසක් එකී ආයතනයන්හී කැමැත්ත ඇත්තේ නම් මෙම ''ගිණුම'' සඳහා වාර්ෂිකව බැර කළ හැකිය.

11.5. ආයුර්වේද දෙපාර්තමේන්තුව නමින් ලබන දේශීය හා විදේශීය පරිත්‍යාග, ආධාර හා ප්‍රදානයන් ගිණුමට බැර විය යුතු ය.

ගිණුමේ පාලක මණ්ඩලයේ සංයුතිය.

12.1. ගිණුමේ පාලනය පස් දෙනෙකුගෙන් යුත් පාලක මණ්ඩලයක් මගින් සිදු කළ යුතු ය.

12.2. මෙම ගිණුමේ පාලක මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

I. ඌව පළාතේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා,

II. ඌව පළාත් ආයුර්වේද කොමසාරිස්,

III. ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ නියෝජිතයෙක්,

IV. ඌව පළාත් පාලන කොමසාරිස් හෝ ඔහුගේ නියෝජිතයෙක්,

V. විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන දේශීය හෝ පාරම්පරික හෝ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ වෛද්‍යවරයෙක්.

13.1. ගිණුමට ලැබෙන සියලුම මුදල් නියමිත පරිදි ගිණුම්ගත කරනු ලැබිය යුතු අතර, මෙම ගිණුම් වාර්ෂිකව විගණකාධිපති හා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් විගණනය කළ යුතු ය. විගණනය.

13.2. ගිණුමේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වන්නේ ය.

14.1. පළාත් ආයුර්වේද කොමසාරිස් සෑම වර්ෂයකම ගිණුම් වාර්තා ඊළග වර්ෂයේ අප්‍රේල් 30 දිනට පෙර විගණකාධිපති හා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කිරීමට බැඳි සිටී. ගිණුම සම්බන්ධයෙන් පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාගේ වගකීම.

14.2. ගිණුමේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා ඌව පළාත් දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වන අතර, පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා එහි ලේකම්වරයා විය යුතු ය.

14.3. මෙම ගිණුමේ ගිණුම 1987 අංක 42 දරන පළාත් සභා පනතේ III වැනි කොටසේ 19 වැනි වගන්තියේ විධිවිධානවලට අනුකූල විය යුතු ය.

14.4. පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගිණුමට අදාළව සුදුසු ව්‍යවස්ථාවක් සකස් කොට විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව එය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

15.1. වඳවී යන දේශීය ඖෂධ හා පැළෑටි වර්ග සංරක්ෂණය කිරීම, ඒවා හඳුනා ගැනීම සඳහා නාමපුවරු පිහිටුවීම හා ජනතාව දැනුවත් කිරීම අරමුණු කොට පළාතේ ආයුර්වේද රෝහල්, මධ්‍යම බෙහෙත් ශාලා, තෝරාගත් පාසල් හා රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ ඖෂධ උද්‍යාන පිහිටුවීම හා ඖෂධ තවාන් ඇති කිරීමට පියවර ගත යුතු ය. ඖෂධ උද්‍යාන පිහිටුවීම.

15.2. ඔසු උයන් පිහිටුවීම සඳහා රජයේ ඉඩම් ලබා ගැනීමේදී 454 අධිකාරිය වූ 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනත යටතේ පනවා ඇති විධිවිධානවලට අනුව ඉඩම් ලබා ගැනීම කළ යුතු ය.

15.3. ඔසු උයන් පවත්වාගෙන යාම හා තවාන් පවත්වාගෙන යාම පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ අධීක්ෂණයට යටත්ව මින් මතු සඳහන් කරනු ලබන ප්‍රාදේශීය ආයුර්වේද සංරක්ෂණ සභාවන්හී වගකීම වන්නේ ය.

15.4. ඖෂධ පැළ තවාන්වලින් පැළ විකිණීම මෙම ප්‍රඥප්තිය යටතේ නීත්‍යානුකූල වන්නේ ය.

16.1. මෙහි මින් මතු මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන හා පළාතේ ආයුර්වේද අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලය නමින් හැඳින්විය යුතු මණ්ඩලයක් පිහිටුවිය යුතු ය. පළාත් ආයුර්වේද, අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලය සංස්ථාපනය කිරීම.

16.2. එකී මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) ආයුර්වේද කොමසාරිස්වරයා,

(ආ) නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයා,

(ඇ) දියතලාව ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂවරයා හා මැදගම ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂවරයා,

(ඈ) අනෙකුත් ආයුර්වේද ආයතන හා පළාත් පාලන ආයතනවලින් අමාත්‍යවරයාගේ නිර්දේශය මත පත් කර ගන්නා ලද වෛද්‍යවරුන් දෙදෙනෙක්,

(ඉ) ඇමතිවරයාගේ නිර්දේශය මත තෝරා ගන්නා ලද රාජ්‍ය සේවයේ නොවන දේශීය, පාරම්පරික හෝ ආයතනික පුහුණුව ලත් වෛද්‍යවරුන් තිදෙනෙක්,

(ඊ) මෙම පළාත් ආයුර්වේද අධ්‍යාපන හා පුහුණු කළමනාකරණ මණ්ඩලයේ කාර්යයන් සඳහා සුදුසු ව්‍යවස්ථාවක් සකස් කොට දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා එකඟතාව මත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(උ) එකී මණ්ඩලයේ නිල කාලය අවුරුදු 03 කි. ගණපූර්ණය 1/3 අඩු නොවිය යුතු ය.

මණ්ඩලයේ බලතල.

17. පහත සඳහන් බලතල පුහුණු කළමනාකරණ මණ්ඩලයට තිබිය යුතු ය :—

(අ) පළාතේ ආයුර්වේදයට අදාළ රාජ්‍ය අංශයෙහි පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ආ) පළාතේ පාරම්පරික හා දේශීය ආයුර්වේද වෛද්‍යවරුන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ඇ) ආයුර්වේද අංශයට අදාළ අනෙකුත් සේවා සඳහා උචිත පාඨමාලා තීරණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඈ) ආයුර්වේද අධ්‍යාපනයෙහි යෙදෙන අයට අදාළ ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර හා වෙනත් ත්‍යාග හා ආධාර පිරිනැමීම.

(ඉ) අධ්‍යාපන පද්ධති, පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා කළමනාකරණය.

(ඊ) පුහුණු කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීම.

(උ) සම්මාන, අභිඥාන පත්‍ර හෝ සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.

පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලය සංස්ථාපනය කිරීම.

18.1. මින් මතු පර්යේෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන ඌව පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලය නමින් හැඳින්විය යුතු ආයතනයක් පිහිටුවිය යුතු ය.

18.2. මෙම ප්‍රඥප්තියේ 4.1 වගන්තියේ සඳහන් නියෝජ්‍ය ආයුර්වේද කොමසාරිස්වරයා ඇමතිවරයා විසින් පර්යේෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කළ යුතු ය.

18.3. පර්යේෂණ මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය :—

(අ) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා,

(ආ) නාවින්න ආයුර්වේද පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ හෝ ඔහුගේ නියෝජිතයෙක්,

(ඇ) පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවයට අනුයුක්ත නිලධාරියෙක්,

(ඈ) විශේෂඥ වෛද්‍යවරුන් අතරින් ඇමතිවරයාගේ නිර්දේශ මත පත්කරනු ලබන අයෙක්,

(ඉ) දියතලාව ආයුර්වේද රෝහලේ අධ්‍යක්ෂවරයා,

(ඊ) මැදගම ආයුර්වේද රෝහලේ වෛද්‍ය අධිකාරිවරයා,

(උ) පළාත් හෝ පළාත් පාලන ආයතනයන්හි සේවයේ නියුතු වෛද්‍යවරුන් දෙදෙනෙක්,

(ඌ) පාරම්පරික හෝ දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් අතුරින් ඇමතිවරයාගේ නිර්දේශ මත පත් කරනු ලබන වෛද්‍යවරයෙක්.

18.4. පර්යේෂණ මණ්ඩලයේ නිල කාලසීමාව අවුරුදු 3 කි. ගණපූර්ණය 1/3 අඩු නොවිය යුතු ය.

18.5. ඉහත පළාත් ආයුර්වේද පර්යේෂණ මණ්ඩලයේ කාර්යයන් සඳහා අදාළ ව්‍යවස්ථාවක් පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා විසින් සම්පාදනය කොට පළාත් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා හා පළාත් දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව මත ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

මණ්ඩලයේ කාර්ය භාරය.

19. ආයුර්වේද සංවර්ධනය හා එකී කටයුතු වැඩිදියුණු කිරීමේ අදහසින් ආයුර්වේදයෙහි සියලුම අංශවල පර්යේෂණ කටයුතු පැවැත්වීම සම්බන්ධයෙන් සහ විශේෂයෙන් පහත සඳහන් කාර්යයන් පිළිබඳ වගකීම ඉහත 18.1 වගන්තිය යටතේ ස්ථාපිත කරනු ලබන පර්යේෂණ මණ්ඩලයට පැවරේ, එනම් :—

(අ) පර්යේෂණ ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කිරීම,

(ආ) පාරම්පරික දැනුම සංරක්ෂණය කළ හැකි ආයුර්වේද කෞතුකාගාරයක් පිහිටුවා පවත්වාගෙන යාම,

(ඇ) ඖෂධ පැළෑටි, අමු ඖෂධ, නිමි ඖෂධ හා විවිධ සංස්කරණයක් පිළිබඳ පර්යේෂණ කටයුතු පැවැත්වීම,

(ඈ) රෝග නිදාන, රෝග සහ ඒවාට උචිත චිකිත්සා ක්‍රම පිළිබඳ කාලීන අවශ්‍යතාවයන් අනුව පර්යේෂණ කටයුතු මෙහෙයවීම,

(ඉ) ආයුර්වේද පර්යේෂණ හා එවැනි පර්යේෂණ ආයතන පිළිබඳ කළමනාකරණය.

(ඊ) පහත සඳහන් දේ ගැන එනම්,

I. ආයුර්වේද සාහිත්‍ය,

II. ආයුර්වේද ශාස්ත්‍රයෙහි මූල ධර්ම,

III. ආයුර්වේද රස වෛද්‍ය ක්‍රමය,

IV. ජ්‍යොතිෂ්‍ය, ශාන්ති කර්ම, කෙම් ක්‍රම සහ වෙනත් ආශ්‍රිත චිකිත්සීය විවිධ ක්‍රම

V. ආයුර්වේදයට අනුගත වෙනත් දේශීය ස්වභාවික වෛද්‍ය ක්‍රම ගැන පර්යේෂණ කටයුතු කිරීම.

(උ) ආයුර්වේද ද්‍රව්‍ය ගුණ ශාස්ත්‍රය ගැන පර්යේෂණ කටයුතු කිරීම.

(ඌ) වෘක්ෂායුර්වේදය සහ සත්වායුර්වේදය පිළිබඳ පර්යේෂණ කටයුතු කිරීම.

(එ) ආයුර්වේද වෛද්‍ය සභාව විසින් කලින් කලට කරනු ලබන පර්යේෂණ කටයුතුවලට අදාළ නියමයන් පිළිපැදීම, පර්යේෂණ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කිරීමද, පර්යේෂණ මණ්ඩලයේ වගකීම වන්නේ ය.

(ඒ) ආයුර්වේදයට අවශ්‍ය ඖෂධිය ශාකවලට හානිදායක අක්‍රමණික හා සංක්‍රමණික ශාක පිළිබඳ අවධානය යොමු කිරීම හා මර්ධනය කිරීමට කටයුතු කිරීම.

20. පහත සඳහන් බලතල පර්යේෂණ මණ්ඩලයට තිබිය යුතු ය :— මණ්ඩලයේ බලතල.

(අ) පර්යේෂණ ආයතන, පර්යේෂණ කාර්යයන් සහ පර්යේෂකයන් සඳහා බලපවත්වන රෙගුලාසි පැනවීමට නිර්දේශ කිරීම,

(ආ) එක් එක් වර්ෂය සඳහා යෝජිත පර්යේෂණ වැඩපිළිවෙලක් සැකසීම හා ඉහතින් සිදු කරන ලද පර්යේෂණ දර්ශකයන් යාවත්කාලීනව පවත්වාගෙන යාම,

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලබන ආයුර්වේද පර්යේෂණ ආයතන සඳහා පාලක අනු මණ්ඩල පත්කිරීම සහ ඊට අදාළ අතුරු ව්‍යවස්ථා පැනවීම,

(ඈ) ආයුර්වේද කටයුතු සඳහා අවශ්‍ය යැයි පර්යේෂණ මණ්ඩලය විසින් තීරණය කරන ලද අවස්ථාවලදී දේශීය පාරම්පරික හා වෙනත් සුදුසු යැයි පර්යේෂණ මණ්ඩලයට හැඟෙන කාලීන අන්තර් විෂය සහයෝගය ලබා ගැනීම,

(ඉ) ආයතන සතු පුද්ගල මණ්ඩල සහයෝගය ලබා ගැනීම,

(ඊ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මෙහෙයවීමෙන් සිදුකෙරෙන යම් පර්යේෂණ ප්‍රතිඵල ආයුර්වේද දෙපාර්තමේන්තුවෙන් පරිබාහිර වූ යම් දේශීය හෝ විදේශීය පුද්ගලයෙක්, පුද්ගල මණ්ඩලයක් හෝ ආයතනයක් බුක්ති විඳින්නේ නම්, ඒ සඳහා මූල්‍යමය හෝ වෙනත් සමාන ප්‍රතිලාභ ලබා ගැනීමට අයිතියක් ඇති අතර, ඒ සඳහා අවශ්‍යවන ක්‍රියා මාර්ගයන්ට පිවිසීමේ අයිතිය,

(උ) ඉහත සඳහන් කාර්යයන් ඉෂ්ඨ කිරීම සඳහා කලින් කළ නිශ්චය කරනු ලබන කාර්ය මණ්ඩලයක් පත්කළ යුත්තේ ය.

21.1. මින් මතු සමාලෝචන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන පළාත් ආයුර්වේද ඖෂධ සමාලෝචන මණ්ඩලයක් පිහිටුවිය යුතු ය. පළාත් ආයුර්වේද ඖෂධ සමාලෝචන මණ්ඩලය.

21.2. මෙම ප්‍රඥප්තියේ 4.1. වගන්තියෙහි සඳහන් නියෝජ්‍ය හෝ සහකාර ආයුර්වේද කොමසාරිස්වරුන් අතරින් එක් අයෙකු ඇමතිවරයා විසින් ඖෂධ සමාලෝචන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් කළ යුතු ය.

21.3. ඖෂධ සමාලෝචන මණ්ඩලය පහත දැක්වෙන සාමාජික සංඛ්‍යාවකින් සමන්විත යුතු ය :—

(අ) පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරිවරයා,

(ආ) පළාත් ඖෂධ නිෂ්පාදනාගාරයේ ප්‍රධාන භෛෂජ්ජකවරයා,

(ඇ) පළාතේ ආයුර්වේද අධ්‍යාපන ආයතනයන්හි ආචාර්ය මණ්ඩල අතුරින් ඇමතිවරයාගේ නිර්දේශ මත පත්කරනු ලබන එක් වෛද්‍යවරයෙක්,

(ඈ) පළාත තුළ ලියාපදිංචි ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර ප්‍රධානීන් අතුරින් ඇමතිවරයාගේ නිර්දේශය මත පත් කරගන්නා අයෙක්.

22. පළාත් ආයුර්වේද ඖෂධ සමාලෝචන මණ්ඩලයට පහත සඳහන් බලතල තිබිය යුතු ය :—

(අ) පළාත තුළ ඖෂධ ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම හා එය ක්‍රියාත්මක කිරීම,

(ආ) පළාත තුළ ඖෂධ බෙදාහැරීම හා භාවිතය විධිමත් කිරීම,

(ඇ) පළාත තුළ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, අධීක්ෂණය විධිමත් කිරීම හා ප්‍රමිති හඳුන්වාදීම,

(ඈ) ඖෂධවල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම හා අන්තරායකාරී නොවන බවට සහතික කිරීම,

(ඉ) සියලුම ආයුර්වේද ඖෂධ වර්ග 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා ඊට අදාළ සංශෝධන පනත් හා ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ නීතිමය විධිවිධානයන්ට යටත්ව නිෂ්පාදනය කරන බවට වග බලා ගැනීම,

(ඊ) අන්තරායකාරී මෙන්ම අනෙකුත් අනුශාංගික අණ පනත්වලට පටහැනි ලෙසට සිදු කරනු ලබන නිෂ්පාදන සම්බන්ධ නීතිමය කටයුතු කිරීම සඳහා ආයුර්වේද කොමසාරිස් වෙත නිර්දේශ ලබාදීම,

(උ) පළාත තුළ ආයුර්වේද ඖෂධ නිෂ්පාදන අලෙවි කරන ස්ථාන පිහිටුවීම, ලියාපදිංචි ගාස්තු අය කිරීම, ඖෂධ සංයෝජකයින් පුහුණු කිරීම, පත් කිරීම හා ලියාපදිංචිය අවලංගු කිරීම,

(ඌ) ආයුර්වේද ඖෂධ සම්බන්ධයෙන් හා ඖෂධ නිධි පවත්වාගෙන යාම සම්බන්ධව තත්කාලයේ පවත්නා අනෙකුත් නීතිමය ප්‍රතිපාදන හඳුනාගැනීම, හඳුන්වාදීම හා ක්‍රියාත්මක කරවීම,

(එ) ආයුර්වේද නිමි ඖෂධ, වියළි හා අමු ඖෂධ, අපනයනය කිරීම හා ඌව පළාතට ආවේණික වූ ඖෂධීය ශාකවලට පේටන්ට් බලපත්‍ර ලබා ගැනීම පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ නිර්දේශ මත පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත සිදුවිය යුතු ය,

(ඒ) ඌව පළාතේ පවත්නා ස්වාභාවික ඖෂධ පළාතෙන් පිටතට ප්‍රවාහනය සඳහා අවශ්‍ය බලපත්‍ර නිකුත් කිරීම, නිර්දේශ කිරීම සහ බලපත්‍ර ගාස්තු නියම කිරීම.

සියලුම මණ්ඩල සඳහා වූ පොදු කරුණු.

23.1. සියලුම මණ්ඩලවල නිල කාලය ලිත් වර්ෂ 03 ක් වන්නේ ය.

23.2. ඇමතිවරයාගේ අභිමතය පරිදි මණ්ඩලවල නිල කාලය ගැසට් පත්‍රයක පළ කරනු ලබන දැන්වීමකට පසු අවසන් කළ හැක්කේ ය.

23.3. මණ්ඩලයක ගණපූර්ණය 1/3 අඩු නොවිය යුතු ය.

23.4. සියලු මණ්ඩලවල රැස්වීම් අවම ලෙස මසකට එක් වරක් හෝ පැවැත්විය යුතු ය.

23.5. මණ්ඩලයක රැස්වීම් වාරයක් වෙනුවෙන් සාමාජිකයන් සඳහා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන පාරිශ්‍රමිකයක් ගෙවිය හැක.

23.6. රැස්වීම් වාර 03 කට නොපැමිණීම සාමාජිකත්වය අහෝසි වීමට හේතු වනු ඇත.

ආයුර්වේද රෝහල් කමිටු ස්ථාපනය කිරීම.

24.1. ආයුර්වේද රෝහලක් සහ ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාවක් මගින් ගුණාත්මක සේවයක් ලබාදීම හා එකී ආයතනයන්හී සංවර්ධනය හා ඊට අවශ්‍ය පහසුකම් හා උපදෙස් ලබාදීම සඳහාත්, මහජනයා අතර සමීප සම්බන්ධතාවයක් ඇති කිරීමත්, අරමුණු කොට සෑම ආයුර්වේද රෝහලක් සහ මධ්‍යම බෙහෙත් ශාලාවක් ආශ්‍රයෙන්ම රෝහල් සංවර්ධන කමිටු පිහිටුවිය යුතු ය.

24.2. එකී ආයුර්වේද රෝහල් සංවර්ධන කමිටුව පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය.

(අ) කමිටුවේ සභාපති ආයතන භාර වෛද්‍යවරයා විය යුතු අතර, පළාත් ආයුර්වේද කොමසාරිස්වරයා, පළාත් පාලන ආයතන ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා මෙම කමිටුවේ අනුශාසකවරුන් ලෙස නිල බලයෙන් පත් වන්නේය. මෙම කමිටුව සඳහා දේශීය වෛද්‍ය පළාත් ගරු ඇමතිතුමාගේ එකඟතාවය ලැබිය යුතු ය.

(ආ) කමිටුවේ කැඳවුම්කරු, කමිටුවේ ලේකම්වරයා විය යුතුය. කමිටු සාමාජිකයින් අතුරෙන් ලේකම්වරයා පත් කළ යුතු ය.

24.3. පහත සඳහන් අය කමිටු සාමාජිකයන් ලෙස පත් කළ යුතු ය :—

(අ) ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ සභාපති හෝ ලේඛකාධිකාරි ස්වාමීන් වහන්සේ,

(ආ) සමථ මූල මණ්ඩල සභාපතිවරයා,

(ඇ) ප්‍රදේශයේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියෝජිතයෙක්,

(ඈ) ප්‍රදේශයේ පදිංචි නීතිඥවරයෙකු හෝ සමාදාන විනිශ්චයකාරවරයෙක්,

(ඉ) ආයුර්වේද සංරක්ෂණ සභාවේ සභාපතිවරයා හෝ ලේකම්වරයා,

(ඊ) සංස්කෘතික නිලධාරි, සමාජ සේවා නිලධාරි, සමෘද්ධි සංවර්ධන නිලධාරි, කෘෂි පර්යේෂණ නිෂ්පාදන සහකාර, කෘෂි උපදේශක, ගොවිජන සේවා සංවර්ධන නිලධාරි,

(උ) ප්‍රදේශයේ ආගමික නායකතුමන්,

(ඌ) ග්‍රාම සේවා නිලධාරිවරයා,

(එ) ප්‍රදේශයේ පදිංචි ප්‍රභූවරයෙක්,

(ඒ) ප්‍රදේශයේ ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා.

කමිටුවේ වගකීම් හා කාර්යභාරය.

25.1. රෝහල් කමිටුවකට රෝහල් සංවර්ධන අරමුදලක් පවත්වාගෙන යා හැකි අතර, එය විධිමත් පරිදි ගිණුම්ගත කරනු ලැබිය යුතු ය.

25.2. මෙම අරමුදල වාර්ෂිකව විගණකාධිපති හා අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ විසින් විගණනය කළ යුතු ය.

25.3. අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් වේ.

25.4. ඉහත රෝහල් කමිටුවේ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීමට අදාළ ව්‍යවස්ථාවක් සකස් කොට දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයාගේ එකඟතාව මත ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

25.5. අරමුදලින් රු. 10,000 සිට රු. 50,000 දක්වා කරනු ලබන වියදම් සඳහා පළාත් ආයුර්වේද කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර, ඊට වඩා වැඩි මුදලක් වියදම් කරන විට විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු ය.

25.6. සියලුම සාමාජිකයන්ගේ ධූර කාලය වසර 3 ක් වන්නේ ය.

25.7. රෝහල් කමිටුවක සාමාජිකයන් ඉවත් කිරීමේ හා පත් කිරීමේ බලය හා කමිටු විසුරුවා හැරීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේ ය.

25.8. කමිටුවේ ඕනෑම සාමාජිකයෙකුට ඕනෑම අවස්ථාවකදී අමාත්‍යවරයාට ලිඛිතව දැනම් දීමකින් ඉල්ලා අස්විය හැකිය. එම ඉල්ලා අස්වීම පිළිගැනීම හෝ පිළිනොගැනීම අමාත්‍යවරයාගේ අභිමතය මත සිදුවිය යුතු ය.

25.9. කමිටු රැස්වීමට ගණපූර්ණය 1/3 ට අඩු නොවිය යුතු ය.

25.10. සභාපති කමිටු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු අතර, ඔහු නොමැති අවස්ථාවක කමිටු සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත පත් කරනු ලබන සභාපතිට කමිටුවේ කටයුතු කරගෙන යාමට බලය ඇත්තේය. එම කමිටුව ගන්නා තීරණය බල සහිත විය යුතු ය.

25.11. කමිටුව අවම වශයෙන් දෙමසකට වරක්වත් රැස්විය යුතු අතර, කමිටු වාර්තාව ලේකම් විසින් පළාත් ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

25.12. කමිටුවේ සාමාජිකයන් හෝ සාමාජිකයන්ගේ කලත්‍රයා හෝ පවුලේ කිසිකෙනෙකු පළාත් ආයුර්වේද රෝහල් සඳහා කිසිම සැපයීමක්, මිලදී ගැනීමක් හෝ කොන්ත්‍රාත් ගිවිසුමකට බැඳී නොසිටිය යුතු ය.

25.13. 25.12 වගන්තියේ සඳහන් කිසිවක් එළිදරව් වුවහොත් නියමිත විභාගයකින් පසුව එකී සාමාජිකයා ඉවත් කිරීම සඳහා නිර්දේශ අමාත්‍යවරයා වෙත කමිටුවේ ලේකම් විසින් ඉදිරිපත් කළ යුතු ය.

25.14. ස්වකීය කාර්යය ඉටු කිරීමේදි ආයතන ප්‍රධානියා විසින් ලිඛිතව දී ඇති කාලය තුළ හැර කමිටු සාමාජිකයෙකු තනිවම කිසිම වේලාවක ආයතනයට ඇතුළත්වීම හෝ පරීක්ෂා කිරීම නොකළ යුතු වන්නේ ය.

අර්ථ නිරූපනය.

26. ''ඌව පළාත'' යන්නෙන් බදුල්ල සහ මොණරාගල යන පරිපාලන දිස්ත්‍රික්ක අයත් පාලන ප්‍රදේශ අදහස් වේ.

''ආණ්ඩුකාරවරයා'' යන්නෙන් ඌව පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

''අමාත්‍ය මණ්ඩලය'' යන්නෙන් ඌව පළාත් සභාවේ අමාත්‍ය මණ්ඩලය අදහස් වේ.

''අමාත්‍යවරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ. පළාත් සභාව විසුරුවා හැරුණු අවස්ථාවක ''ඌව පළාත් සෞඛ්‍ය විෂයභාර අමාත්‍යවරයා'' යන්නෙන් ''ඌව පළාත් ගරු ආණ්ඩුකාරවරයා'' අදහස් කෙරේ.

''ප්‍රධාන ලේකම්'' යන්නෙන් ඌව පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා අදහස් වේ.

''ලේකම්'' යන්නෙන් ඌව පළාත් සභාවේ දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

''කොමසාරිස්වරයා'' යන්නෙන් ඌව පළාත් සභාවේ ''ආයුර්වේද කොමසාරිස්වරයා'' අදහස් වේ.

''පළාත් පාලන ආයතන'' යන්නෙන් ඌව පළාතේ මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා අදහස් වේ.

''ආයුර්වේදය'' යන්නට ආයුර්වේදය, සිද්ධ, යුනානි හා දේශීය චිකිත්සා ක්‍රමවල වෛද්‍ය කර්ම හා ශල්‍ය කර්මද, පංචකර්ම ප්‍රතිකාර ක්‍රම, ස්පා (Spa) ප්‍රතිකාර ඒ ඒ රටවලට දේශීය වූ ද, ඒ ඒ රටවල රජයක් මගින් එසේ යැයි පිළිගනු ලැබුවා වූ ද, වෙනයම් වෛද්‍ය ක්‍රමයන් ද ඇතුළත් වන අතර, ශාකමය, ස්වාභාවික දේශීය විකල්ප, සමාන්තර, පෙරදිග, පාරම්පරික, සම්පූරක සහ හෝ ඊට සමාන අර්ථයක් දෙන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කරනු ලබන කිසියම් ප්‍රතිකාර ක්‍රමයක් හෝ ක්‍රම හෝ රෝග නිවාරණ හෝ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රම හෝ ක්‍රමයන් ද ඇතුළත් වේ.

''දේශීය වෛද්‍ය හා පාරම්පරික වෛද්‍ය'' යන්නෙන් මෙතෙක් ලියාපදිංචි වී ඇති හෝ නොමැති ඌව පළාතේ පදිංචි සියලුම දේශීය වෛද්‍යවරුන් අදහස් වේ.

''අනුෂාංගික අනෙකුත් සේවාවන් '' යන්නෙන් ජ්‍යොතිෂ ශාස්ත්‍රඥයින්, භූත කර්මයෙහි යෙදී සිටින්නන් අදහස් වේ.

''ඔසු උයන්'' යන්නෙන් දේශීය, පාරම්පරික හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සඳහා යොදා ගන්නා ගස් වැල්, පැළැටි වර්ග ඇතුළත් උයන් ද අදහස් වේ.

වචනාර්ථ.

27. මෙම ප්‍රඥප්තියෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

06-337/2

---

**ඌව පළාතේ පළාත් සභාව**

ඌව පළාත් සභාවේ 2010 අංක ............ දරන අනාථ, අත්හළ සහ අසරණ ළමා නිවාස ප්‍රඥප්තිය

මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවීමෙන් දින 10 ක් ඉක්ම ගිය පසු ඌව පළාත් සභාවට ඉදිරිපත් කරන බව දන්වා සිටිනු ලැබේ. මෙම ප්‍රඥප්තියේ අඩංගු කරුණු සම්බන්ධයෙන් යම්කිසි කරුණක් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම දැන්වීමෙන් දින 10 ක් තුළ දී එකී කරුණු මා වෙත දැනුම් දිය යුතුය.

ඒ. එම්. බුද්ධදාස,
ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා
ළමාරක්ෂක කටයුතු හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍ය.

2010 මැයි මස 08 වැනි දින,
ඌව පළාතේ පළාත් සභාවේ,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා
ළමා කටයුතු හා වනිතා කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ඌව පළාත් සභාවේ 2010 අංක ................ දරන අනාථ, අත්හළ හා අසරණ ළමා නිවාස ප්‍රඥප්තිය

***ඌව පළාතේ ජීවත් වන අනාථ, අත්හළ සහ අසරණ ළමයින්ගේ නඩත්තුව සහ ආරක්ෂාව සැළසීම සඳහා ආයතන ලියාපදිංචි කිරීමත්, ඒවා අධීක්ෂණය, පරිපාලනය විධිමත් කිරීම සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස සහ ඒ සම්බන්ධ හෝ ඊට අනුෂාංගික වෙනත් කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ ප්‍රඥප්තියකි***

මෙම ප්‍රඥප්තිය 142 වැනි අධිකාරය වන අනත්දරු නිවාස ආඥාපනතට අනුකූල වන්නේ ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඌව පළාත් සභාව මගින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය ඌව පළාත් සභාවේ 2009 ........ දරන අනාථ අත්හළ සහ අසරණ ළමා නිවාස ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර ඌව පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබන දින සිට හෝ නියම කරන පසු දිනක සිට හෝ ක්‍රියාත්මක වේ. ‍ලුහුඩු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

02. මින් ඉදිරියට ''ළමා නිවාසයක්'' යනුවෙන් හඳුන්වන්නේ වයස අවුරුදු 05 සිට 18 දක්වා සීමාවේ අනාථ, අත්හළ සහ අසරණ ළමයින්ට නේවාසික ආරක්ෂාව සපයනු ලබන නිවාසයක් වේ. අනාථ, අත්හළ සහ අසරණ ළමා නිවාසයක කළමනාකරු විසින් එම නිවාසය ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පතක් පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ළමා නිවාසයක් පිහිටුවීම.

03. මෙම ප්‍රඥප්තිය යටතේ ඌව පළාතේ ක්‍රියාත්මක ළමා නිවාස ලියාපදිංචි කළ යුතුය. ලියාපදිංචිය සඳහා අයදුම් කරනු ලබන සෑම ළමා නිවාසයක්ම මෙහි පහත සඳහන් නියමයන් හා කොන්දේසිවලට යටත් විය යුතු ය. ලියාපදිංචිය සඳහා වූ අවශ්‍යතා.

(අ) ළමා නිවාසයක් පවත්වාගෙන යෑමේ කාර්යයක් සඳහා වූ ස්වේච්ඡා සංවිධානයක් මගින් නිවාසයක් පවත්වාගෙන යා යුතු ය.

(ආ) (මින් ඉදිරියට ''මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන) සභාපති, උප සභාපති, ලේකම්, භාණ්ඩාගාරික සහ කළමනාකරුගෙන් සමන්විත වන කළමනාකරන මණ්ඩලයකින් යුක්ත විය යුතු ය.

(ඇ) මණ්ඩලයේ සාමාජිකයින් අතරින් තිදෙනෙකු ළමා නිවාසය පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය.

(ඈ) කලින් කලට පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයන් මගින් නියම කරනු ලබන ප්‍රමිතීන් සහ කාර්යය පටිපාටිවලට අනුකූලව නිවාසය කටයුතු කළ යුතු ය.

04. පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත අයදුම්පතක් ලද විටෙක හෝ අනුමැතියකින් තොරව ළමා නිවාසයක් පවත්වා ගෙන යන බවට හෝ පැමිණිල්ලක් ලද විටෙක හෝ ඔහු විසින් ඕනෑම පරිවාස නිලධාරියෙකුට හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් නිලධරයෙකුට පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සති 04 ක් ඇතුළත වාර්තාවක් ලබාදෙන ලෙස නියම කළ යුතු ය. වාර්තා ලබාගැනීම.

(අ) එකී ළමා නිවාසයේ නේවාසිකව සිටින ළමුන්ගේ උපරිම සුභ සිද්ධිය එම ළමා නිවාසය මගින් සැලසෙන බව ;

(ආ) තුන්වන වගන්තිය යටතේ පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් නියම කර ඇති ප්‍රමිතීන්වලට අනුකූලව ක්‍රියාකර ඇති බව.

05. 4 වැනි වගන්තිය යටතේ වූ වාර්තාව ලද පසුව, එහි නේවාසික ළමයින්ගේ සුභ සිද්ධිය එම නිවාසය මගින් සැළසීම සහ අපේක්ෂිත ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාකර තිබේ දැයි පරීක්ෂා කර බැලීම සඳහා ඕනෑම අවස්ථාවකදී මෙම ළමා නිවාසයට ඇතුළුවීමට ඌව පළාත් පරිවාස කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුට හැකිවන්නේ ය. පෞද්ගලික පරීක්ෂණය.

ලියාපදිංචි කිරීම.

06. 5 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයෙන් පසුව පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් සාධාරණව සෑහීමකට පත්වන්නේ නම් :—

(අ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙර ආරම්භ කරන ලද ළමා නිවාසයක් නම් මාස 05 ක් ඇතුළත ද ;

(ආ) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පසුව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පතක් නම්, මාස 06 ක් ඇතුළත ;

(ඇ) දැනට ලියාපදිංචි කර ඇති ළමා නිවාසයක් නම් මෙම ප්‍රඥප්තිය අනුමත වී මාස 06 ක් ඇතුළත

ඒ ළමා නිවාසය ලියාපදිංචි කිරීමට පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතුය.

ප්‍රමිතීන්ට අනුව කටයුතු කරගෙන යාමට ගිවිස ගැනීම.

7.1. පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් අපේක්ෂිත ප්‍රමිතීන් වලින් 10% ක් වත් මණ්ඩලය විසින් කළ යුතු ය.

7.2. ඉතිරි ප්‍රමිතී අවශ්‍යතාවන් ළමා නිවාසය ලියාපදිංචි කිරීමෙන් පසු වසර 03 ක් ඇතුළත සපුරාලීමට භාර ගනිමින් සෑම ළමා නිවාසයකම කළමනාකරුවෙකු විසින්ම පළාත් පරිවාස කොමසාරිස්වරයා සමග ගිවිසුමකට එළඹිය යුතු ය.

සහතිකය නිකුත් කිරීම.

8.1. ළමා නිවාසය ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන්, නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් ඒ ළමා නිවාසය භාර කළමනාකරු වෙත නිකුත් කළ යුතු ය.

8.2. තමා විසින් ලියාපදිංචි කරන ලද සෑම ළමා නිවාසයක්ම සම්බන්ධයෙන්ම, එම ළමා නිවාසයේ නම, ලිපිනය, පදිංචි කිරීමේ අංකය සහ දිනය, ස්වෙච්ඡා සංවිධානයක් වේ නම් එහි නම සහ කොමසාරිස්වරයාට අවශ්‍ය යැයි හැඟී යන වෙනත් තොරතුරු වේ නම්, ඒවා ඇතුළත් ලේඛනයක් පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් පවත්වාගෙන යා යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ නිවේදනය.

09. ළමා නිවාස අවශ්‍ය ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වී ඇතැයි සහ එම ළමා නිවාසයට 3 වැනි වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් නොමැති බවට පරීක්ෂණයකදී සනාථ වුවහොත් එම ළමා නිවාසය ලියාපදිංචි කළ නොහැකි බවට පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් කළමනාකරු වෙතට දැන්විය යුතුය. (ස්වෙච්ඡා ළමා නිවාස වල සේවා තත්ත්වය නගා සිටුවීම සඳහා පොදු ප්‍රමිතීන් නියම කිරීම ඇමුණුම් 01 හි දක්වා ඇත.)

ලේකම් වෙත අභියාචනාවක් ඉදිරිපත් කළ හැකි බව.

10. පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ලියාපදිංචිය ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම සම්බන්ධයෙන් නොසෑහීමකට පත් යම් ළමා නිවාසයක කළමනාකරුවෙකු විසින් එම දැන්වීමේ දින සිට දින 30 ක් ඇතුළත ඌව පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු ය.

අභියාචන පිළිබඳ තීරණ.

11.1. එකී ලේකම්වරයා විසින් හෝ ඔහු විසින් පත් කරන තැනැත්තන් දෙදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු ය.

11.2. (1) පළමුවැනි උප වගන්තියේ සඳහන් මණ්ඩලයට ඇතුළත් තැනැත්තන් දෙදෙනා, පළාත් පරිවාස කොමසාරිස්වරයාගේ තනතුරට සමාන හෝ පළාත් පරිවාස කොමසාරිස්වරයාගේ තනතුරට වඩා උසස් තනතුරු දරන තැනැත්තන් විය යුතු ය.

11.3. පරීක්ෂණයේ තීරණය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) ඒ ළමා නිවාසය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීමේ හේතුන් දක්වමින් ළමා නිවාසයේ කළමනාකරු වෙත දන්වා යැවීම,

(ආ) ළමා නිවාසය ලියාපදිංචි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත දැනුම් දීම ; සහ

(ඇ) 3 වැනි වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් සපුරා ගැනීමට වසරකට නොවැඩි සහනදායී කාල සීමාවක් ලබාදීම සහ එසේ සපුරාලන්නේ නම් ඉන් පසුව නිවාසය ලියාපදිංචි කිරීම අනුමත කිරීම.

12. 11 වැනි වගන්තිය යටතේ දෙන ලද තීරණයක් සම්බන්ධයෙන් අතෘප්තියට පත් පාර්ශවකරුවෙකු විසින් ඒ තීරණයේ සිට දින තිහක් ඇතුළත (මින්මතු "අමාත්‍යවරයා" හඳුන්වනු ලබන) පරිවාස හා ළමාරක්ෂක විෂය භාර පළාත් අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි ය. අමාත්‍යවරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ හැකි බව.

13. 12 වැනි වගන්තිය යටතේ ඉල්ලීමක් ලද විටෙක දී, එකී අමාත්‍යවරයා පළාත් පරිවාස ලේකම්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන රාජ්‍ය නිලධාරීන් විසින් හෝ එවැනි තනතුරු දැරූ විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් විසින් ඒ අභියාචනය පිළිබඳ පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර අමාත්‍යවරයා විසින් 11(අ), (ආ) හෝ (ඇ) වගන්තිය යටතේ අවශ්‍ය පියවර ගත යුතුය. පරිවාස හා ළමාරක්ෂක විෂය භාර පළාත් අමාත්‍යවරයාගේ තීරණය අවසන් තීරණය වේ. අමාත්‍යවරයාගේ තීරණය.

14. ළමා නිවාසයට අදාළ සියළු කටයුතු සම්බන්ධයෙන් ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව සමග කටයුතු කිරීමට හැකියාව ඇති එකම තැනැත්තා ඒ ළමා නිවාසයේ කළමනාකරු වන්නේ ය. කළමණාකරු මණ්ඩලය වෙනුවෙන් කටයුතු කළ යුතු බව.

15. ළමා නිවාසයක සිටින ළමයින්ගේ සුභ සිද්ධිය හෝ එහි පරිපාලනය සම්බන්ධයෙන් පළාත් පරිවාස කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියකු විසින් දෙනු ලබන උපදෙස් හෝ නියෝග අවස්ථාවෝචිත පරිදි, එම ළමා නිවාසයේ කළමනාකරු, මණ්ඩලය සහ කාර්ය මණ්ඩලය අනුගමනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම කළ යුතු ය. උපදෙස් අනුගමනය කළ යුතු බව හා නියෝග ක්‍රියාත්මක කළ යුතු බව.

16.1. පළාත් පරිවාස කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් මගින් ඒ දැන්වීමේ සඳහන් කාලසීමාව ඇතුළත දී යම් තොරතුරු හෝ වාර්තා සපයන ලෙස යම් ළමා නිවාසයක කළමනාකරුට නියම කරනු ලැබිය හැකි ය. තොරතුරු සහ වාර්තා සැපයිය යුතු බව.

16.2. කළමනාකරු විසින් (1) වැනි උපවගන්තිය යටතේ නියම කරන ලද තොරතුරු සැපයීමේ දී වැරදි හෝ ව්‍යාජ තොරතුරු සැපයීමෙන් වැළකි සිටිය යුතු ය.

17. 15 වැනි සහ 16 වැනි වගන්තිවලට අනුකූලව කටයුතු නොකිරීම නිසා පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් අවස්ථාවෝචිත පරිදි, යම් ළමා නිවාසයක කළමනාකරු හෝ මණ්ඩලය වෙත ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවීමට සැලැස්විය යුතු අතර, එම දැන්වීමේ සඳහන් අවසන් දින තුළ නිසි පියවර ගන්නා ලෙස කළමනාකරුට හෝ මණ්ඩලයට නියම කළ යුතු ය. අවසන් දැන්වීම.

18. 17 වැනි වගන්තියේ සඳහන් දැන්වීමේ වූ අවසන් දිනට ප්‍රථම කටයුතු කිරීමට යම් ළමා නිවාසයක කළමනාකරු හෝ මණ්ඩලය අපොහොසත් වුවහොත් ඒ උපදෙස් පිළිපැදීමට නොහැකිවීමට හේතු දක්වමින් ලිඛිත දැන්වීමක් පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙතට පිටපතක් ද සමගින් ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ඉදිරිපත් කළ යුතු ය. අනුකූලව කටයුතු නොකිරීම පිළිබඳව කළමණාකරුගේ නිදහසට කරුණු.

මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි වී ඇති ළමා නිවාසවල භාරකරුවන්ගේ ක්‍රියාකලාපය පිළිබඳව පැමිණිලි ලැබූ අවස්ථාවල ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට ඌව පළාතේ පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට බලය ඇති අතර කොමසාරිස්වරයා ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට ළමා නිවාසවල කළමනාකරුවන් බැඳී සිටී.

19.1. එකී කරුණු දැක්වීම ලද පසු ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ පළාත් පරිවාස කොමසාරිස්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන පුද්ගලයින් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතු අතර එකී ලේකම්වරයා විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග අතරින් එක් ක්‍රියාමාර්ගයක් ගත යුතු ය. ලේකම්වරයා විසින් පරීක්ෂණයක් පැවැත්විය යුතු බව.

(අ) නියෝගයේ සඳහන් නිශ්චිත කාලසීමාවක් තුළ 15 වැනි හෝ 16 වැනි වගන්තිය යටතේ පියවර ගැනීමට අවස්ථාවෝචිත පරිදි කළමනාකරුට හෝ මණ්ඩලයට නියම කිරීම.

(ආ) 15 වැනි වගන්තිය යටතේ දෙන ලද උපදෙස් හෝ නියෝග සංශෝධනය කිරීම සහ ඒ අනුව ක්‍රියාකරන මෙන් කළමනාකරුට හෝ මණ්ඩලයට නියම කිරීම ; හෝ

(ඇ) 15 වැනි වගන්තිය යටතේ පළාත් පරිවාස කොමසාරිස්වරයා හෝ යම් බලයලත් නිලධාරියකු විසින් දෙන ලද උපදෙස් අනුගමනය කිරීම හෝ නියෝග ක්‍රියාත්මක කිරීම අවශ්‍ය නොවන හෝ 16 වැනි වගන්තිය යටතේ තොරතුරු හෝ වාර්තා සැපයීම අවශ්‍ය නොවන බවට දැනුම් දීම.

19.2. 16 වැනි වගන්තිය යටතේ ඉල්ලීමක් ලද දින සිට දින තිහක් ඉකුත්වීමට ප්‍රථම පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඔහුගේ තීරණය පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙතට එහි ඡායා පිටපතක් ද සමගින් කළමනාකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවිය යුතු ය.

ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණයක් බව.

20. ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසන් තීරණයක් වන අතර එය ක්‍රියාත්මක නොකිරීම වරදක් වන්නේ ය.

ළමා නිවාසයක මණ්ඩලය බලරහිත කිරීම සහ වෙනත් නිසි බලධරයකු පත් කිරීම.

21. 15, 16 සහ 19 වැනි වගන්ති යටතේ වූ විධිවිධාන යම් ළමා නිවාසයක කළමනාකරුවකු හෝ මණ්ඩලයක් විසින් උල්ලංඝනය කරන ලද අවස්ථාවක දී පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් මාණ්ඩලික ශ්‍රේණියට අයත් රාජ්‍ය සේවකයකු හෝ විශ්‍රාම ලත් මාණ්ඩලික ශ්‍රේණියට අයත් වූ රාජ්‍ය සේවකයකු හෝ පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් පිළිගනු ලැබූ ප්‍රසිද්ධ සමාජ සේවකයකු හෝ ඒ ළමා නිවාසය පවත්වාගෙන යෑම සඳහා නිසි බලධරයා ලෙස පත් කළ යුතු ය.

වත්කම් භාරදීම හා මැදිහත් නොවිය යුතු බව.

22. 21 වැනි වගන්තිය යටතේ නිසි බලධරයකු පත්කරන අවස්ථාවකදී පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් ඒ බව කළමනාකරු වෙත ලිඛිතව දැනුම් දිය යුතු අතර, ඔහු විසින් ළමා නිවාසයට අයත් සියලුම චංචල හා නිශ්චල වත්කම් නිසි බලධරයා වෙත භාරදීමට කටයුතු කළ යුතුය. නිසි බලධරයකු පත් කිරීමෙන් පසු කළමනාකරු හෝ පාලන මණ්ඩලයේ සාමාජිකයකු භූමියකට හෝ ගොඩනැගිල්ලකට ඇතුල් නොවිය යුතු අතර ආයතනයේ කිසිදු කාර්යයකට ඔවුන් මැදිහත් නොවිය යුතු ය.

නව කළමණාකරුවෙකු සහ මණ්ඩලයක් පත් කිරීම.

23.1. නිසි බලධරයකු පත් කළ දින සිට මාස දොළහක් ඇතුළත, නව කළමනාකරුවකු සහ මණ්ඩලයක් පත්කර ගැනීම සඳහා එකී ළමා නිවාසය පවත්වාගෙන යන ස්වෙච්ඡා සංවිධානයේ සියළුම සාමාජිකයන්ට රැස්වන ලෙස පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් ලිඛිතව කැඳවීමක් කළ යුතුය. ඔවුන්ගේ රහස් ඡන්දයෙන් නව කළමණාකරුවකු සහ මණ්ඩලයක් පත්කර ගැනීමට පළාත් පරිවාස කොමසාරිස්වරයා කටයුතු කළ යුතු ය.

23.2. 1 වැනි වගන්තිය යටතේ පත්කර ගනු ලබන නව කළමනාකරුට එම ළමා නිවාසයේ සියලුම චංචල හා නිශ්චල වත්කම්, ඔහුගේ පත්වීමේ දින සිට දින හතක් ඇතුළත නිසි බලධරයා විසින් භාරදිය යුතු ය.

23.3. 2 වැනි උපවගන්තිය යටතේ නිසි බලධරයා විසින් නිශ්චල හා චංචල වත්කම් භාරදුන් දින සිට නව කළමනාකරු සහ මණ්ඩලයට අදාළ නිල වල කටයුතු කරගෙන යාමට නිත්‍යානුකූලව බලය ලැබෙන අතර එදින සිට ස්වකීය කාර්යයන් මනා ලෙස ඉටුකළ යුතු වන්නේ ය.

නුසුදුසුකම්.

24. සේවය අවසන් කරන ලද කළමනාකරුවකු හෝ මණ්ඩලයක කිසිදු සාමාජිකයකු ඔහුගේ සේවා අවසන් කළ දින සිට වසර හතක් ගතවන තුරු වෙනත් කවර හෝ ළමා නිවාසයක කළමනාකරුවකු හෝ මණ්ඩලයක සාමාජිකයකු වශයෙන් හෝ නැවත පත් නොකළ යුතු ය.

ළමා නිවාසයක ලියාපදිංචිය අවලංගු කිරීම.

25. (අ) ළමා නිවාසයක් පවත්වාගෙන යනු ලබන ස්වෙච්ඡා සංවිධානයේ පැමිණි ඡන්දය දෙන බහුතර සාමාජික සංඛ්‍යාවකගේ ඡන්දයෙන් එකී නිවාසය පවත්වාගෙන යාමට නොහැකි බවට යෝජනාවක් සම්මත කර, ඒ බව දැන්වීමක් නිකුත් කිරීම මගින් පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත දන්වන ලද අවස්ථාවක දී ;

(ආ) 21 වැනි වගන්තිය යටතේ නිසි බලධරයකු පත් කිරීමට අපහසු අවස්ථාවක දී ;

(ඇ) පාලක මණ්ඩලය විසින් 7 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු කර නොමැති අවස්ථාවක දී ; සහ

(ඈ) පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකු විසින් 19 සහ 23 වැනි වගන්ති යටතේ දෙනු ලබන උපදෙස් සහ නියෝග අනුව කළමනාකරු හෝ මණ්ඩල කටයුතු නොකරන අවස්ථාවක දී

පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසුව, අදාළ ළමා නිවාසයක ලියාපදිංචිය අවලංගු කිරීමට පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් කටයුතු කළ යුතු ය.

ලියාපදිංචිය අවලංගු කිරීමේ දැන්වීම.

26. 25 වැනි වගන්තිය යටතේ කිසියම් ළමා නිවාසයක ලියාපදිංචිය අවලංගු කිරීමට පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලබන අවස්ථාවක දී, ඔහු විසින් එම තීරණයට එළඹුන දින සිට දින තිහක් ඇතුළත ඒ බව අදාළ නිවාසයේ කළමනාකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් දන්වා යැවිය යුතු ය.

අභියාචනාවක් ඉදිරිපත් කිරීම.

27.1. වැනි වගන්තිය යටතේ දෙනු ලබන තීරණය සමග කිසියම් ළමා නිවාසයක කළමනාකරුවෙකු එකඟ නොවන අවස්ථාවක දී එකී තීරණයේ දින සිට දින හතක් ඇතුළත ඔහු විසින් පළාත් පරිවාස කොමසාරිස්වරයාට පිටපතක් ද සමගින් පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු ය.

27.2. (1) වැනි උප වගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක දී පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 28 වැනි වගන්තිය ප්‍රකාර තීරණයක් ගනු ලබන තෙක් අදාළ ළමා නිවාසය පවත්වාගෙන යාමේ බලය එහි කළමනාකරු සහ මණ්ඩලය සතු වේ.

ලේකම්වරයාගේ තීරණය.

28.1. 27 වැනි වගන්තිය යටතේ වූ අභියාචනයක් පළාත් පරිවාස සහ ළමාරක්ෂක සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලද අවස්ථාවක දී ඔහු විසින් හෝ ඔහු විසින් පත් කරන ලද පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ තනතුරට සමාන හෝ එයට වඩා උසස් තනතුරු දරන තැනැත්තන් දෙදෙනෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මගින් කරන ලද පරීක්ෂණයකින් පසුව එකී ලේකම්වරයා විසින් පහත සඳහන් ක්‍රියාවලියන් අතරින් එකක් අනුගමනය කළ යුතු ය :—

(අ) ලියාපදිංචිය අවලංගු කිරීම තහවුරු කිරීම ;

(ආ) පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ තීරණය ක්‍රියාත්මක කරන තුරු ලියාපදිංචිය අවලංගු කිරීම උපරිම වශයෙන් මාස 04 ක් කල් දැමීම ;

(ඇ) ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා වූ පළාත් පරිවාස ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ තීරණය නිශ්ප්‍රභා කිරීම.

28.2. (1) වැනි වගන්තිය යටතේ පළාත් පරිවාස හා ළමාරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය, පළාත් පරිවාස ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා වෙත ද පිටපතක් සහිතව කළමනාකරුගේ අභියාචනය ලැබුන දින සිට තෙමසක් ඇතුළත කළමනාකරු වෙත එකී ලේකම්වරයා විසින් දන්වා යැවිය යුතු ය.

ලියාපදිංචිය අවලංගු කළ අවස්ථාවකදී ගතයුතු ක්‍රියා මාර්ග.

29.1. 25 සහ 28 වැනි වගන්ති යටතේ ලියාපදිංචිය අවලංගු කරන ලද අවස්ථාවකදී, පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් ඒ නිවාසයේ සිටින ළමයින් වෙනත් ළමා නිවාසයකට ඉවත් කිරීමට හෝ දෙමාපියන්ට හෝ භාරකරුවන්ට භාරදීමට හෝ නියම කරනු ලබන වෙනත් ළමා නිවාසයකට මාරු කිරීමට කටයුතු කළ යුතු ය.

29.2. යම් ළමයෙකු වෙනත් ළමා නිවාසයකට මාරු කිරීමේදී, පළාත් පරිවාස කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියා විසින් ඒ ළමයාගේ ආගම ගැන විමසිලිමත් වෙමින් ළමයාට ආගමික කටයුතුවල නියැලීමට පහසුකම් ඇති, එම ළමයා අයත් වන ආගමේ ළමා නිවාසයකට මාරු කිරීමට හැකි සෑම උත්සහයක්ම දැරිය යුතු ය.

ලියාපදිංචිය අවලංගු කළ ළමා නිවාසයක වත්කම් භාරදීම.

30. ලියාපදිංචිය අවලංගු කරන ලද ළමා නිවාසයකට රජය හා ඌව පළාත් සභාව විසින් සපයා තිබූ ස්ථාවර හා ජංගම වත්කම් තමන් විසින් තීරණය කරනු ලබන වෙනත් ළමා නිවාසයකට භාරදීමට පළාත් පරිවාස කොමසාරිස්වරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් නිලධාරියෙකු විසින් කටයුතු කළ යුතු ය.

පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම.

31. මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටවනු ලැබිය යුතු ය.

පළාත් පරිවාස කොමසාරිස්වරයා හා කාර්ය මණ්ඩලය.

32.1. පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ පරිපාලනය හා අධීක්ෂණය සඳහා පළාත් පරිවාස හා ළමාරක්ෂණ සේවා කොමසාරිස්වරයෙකු පත් කළ යුතුය. ඔහු ශ්‍රී ලංකා පරිපාලන I වැනි ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු අතර, ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය.

32.2. පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාට සහායවීම සඳහා ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරින් හා ළමාරක්ෂක නිලධාරින් ඇතුලු ක්ෂේත්‍ර නිලධාරින් කාර්ය මණ්ඩලයක් ද පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහිතව පළාත් කොමසාරිස් කාර්යාලයක් පිහිටවිය යුතුය. අවශ්‍යතාවයක් සැළකිල්ලට ගනිමින් අධිකරණ කොට්ඨාස මට්ටමින් පරිවාස නිලධාරින් මගින් පාලනය වන ප්‍රාදේශීය කාර්යාලයන් පිහිටවිය යුතු අතර, එකී පරිවාස නිලධාරින් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ තම රාජකාරී කටයුතු කළ යුත්තේ ය.

32.3. අනාථ, අත්හළ සහ අසරණ ළමයින්ගේ ශුභ සිද්ධිය ඇති කරලීම සඳහා අවශ්‍ය වන්නා වූ —

(1) ස්වෙච්ඡා ළමා නිවාස ;

(2) සහතික කළ පාසල් ;

(3) රැඳවුම් නිවාස

වැනි ආයතන පිහිටවිය යුතු අතර, ඒවා පරිපාලනය කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධාරින් පත් කළ යුතු වන්නේය. මෙම ආයතනවල නිලධාරින් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ අධීක්ෂණය යටතේ කටයුතු කළ යුතු ය.

**ළමයින් භාරගන්නා පළාත් ළමා නිවාසය.**

33. (මින් ඉදිරියට ''භාර ගන්නා නිවාසය'' යනුවෙන් හඳුන්වනු ලබන) අවුරුදු පහට අඩු අනාථ, අත්හළ සහ අසරණ ළමයින්ගේ ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයකින් යුත්, ළමයින් භාර ගන්නා පළාත් නිවාසයක් පිහිටුවිය යුතුය. එම නිවාසය පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ පරිපාලනයට යටත් වනු ඇත.

33.1. ළමුන් ඇතුළත් කළ හැකි ප්‍රමාණය සම්බන්ධ එකඟත්වයක් දැක්විය යුතු අතර, එම ප්‍රමාණයට වඩා අඩුවෙන් ළමුන් සිටී නම් දෙපාර්තමේන්තුව හෝ අධිකරණය මගින් යොමු කරන ළමුන් භාරගත යුතු වීම.

**අනාථ, අත්හළ හා අසරණ ළමයින් ගැන තොරතුරු සැපයීම.**

34.1. වයස අවුරුදු පහට වඩා අඩු හෝ අනාථ, අත්හළ හා අසරණ ළමයෙකු පිළිබඳව තොරතුරක් දන්නා තැනැත්තෙකු විසින් ඒ බව ඒ තැනැත්තා පදිංචි ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ස්ථානභාර නිළධරයා වෙත හෝ ඕනෑම පොලිස් නිළධරයෙකු, පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ නිළධරයෙකු, නැතහොත් ප්‍රදේශයේ ග්‍රාම නිළධරයා වෙත හෝ දන්වා සිටිය යුතු ය.

34.2. වයස අවුරුදු පහට අඩු අනාථ, අත්හළ සහ අසරණ ළමයෙකු පිළිබඳ තොරතුරක් ලද නිලධාරියා විසින් එකී ළමයා රජයේ රෝහලකට ඇතුළත් කිරීමට පියවර ගත යුතු ය.

**නිවාසයකට ඇතුළත් කළ යුතු බව.**

35.1. 34.2 වැනි වගන්තිය යටතේ රෝහලකට ඇතුළත් කරනු ලැබූ ළමයෙකුට වෛද්‍ය ප්‍රතිකාර අවශ්‍ය නොවන්නේ නම්, එම රෝහල භාර වෛද්‍ය නිළධාරියා විසින් හෝ බලය පවරන ලද වෙනත් වෛද්‍ය නිළධාරියෙකු විසින් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්වරයාගේ අනුමතය මත එකී ළමයා පළාතේ පිහිටි ළමයින් භාරගන්නා නිවාසයට ඇතුළත් කළ යුතු ය.

35.2. එවැනි ළමයකු වෙනුවෙන් අධිකරණ නියෝගයක් අවශ්‍ය වන විටක දී, රෝහල භාර වෛද්‍ය නිලධාරියා විසින් හෝ ඔහු විසින් බලය පවරන වෙනත් වෛද්‍ය නිළධරයෙකු විසින් ඒ බව අදාළ පොලිස් ස්ථානය වෙත දැනුම් දීමට කටයුතු කළ යුතු ය.

**උපත ලියාපදිංචි කළ යුතු බව.**

36. උපන් විගසම අනාථ, අත්හළ සහ අසරණ ළමයෙකු රෝහලින් ඉවත් කිරීමට පෙර ඔහුගේ හෝ ඇයගේ උපත ලියාපදිංචි කිරීම් සඳහා අවශ්‍ය මූලික පියවර රෝහල භාර වෛද්‍ය නිලධරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන වෙනත් වෛද්‍ය නිලධරයකු විසින් ගත යුතු ය.

**පරීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බව.**

37.1. භාරගන්නා නිවාසයකට ඇතුළත් කරනු ලබන සෑම ළමයෙකුගේම සවිස්තර වාර්තාවක් කොට්ඨාසය භාර පරිවාස නිලධාරියා විසින් හෝ පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් බලය පවරන ලද වෙනත් නිලධරයකු විසින් හෝ ඒ ළමයා නිවාසයට ඇතුළත් කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**අධිකරණය හා දෙපාර්තමේන්තු හැර වෙනත් ළමුන් ආයතන වලට ඇතුළත් කර ගැනීම.**

දෙපාර්තමේන්තුව හෝ අධිකරණය මගින් යොමු කර ඇති ළමුන් හැර වෙනත් ළමුන් ආයතනයකට ඇතුල් කර ගත්තේ නම් ඒ සඳහා පළාත් පරිවාස කොමසාරිස්වරයාගේ අනුමැතිය ලබාගත යුතු ය.

37.2. භාරගන්නා නිවාසයට ඇතුළත් කරනු ලබන ළමයාගේ ස්ථාපන කටයුතු පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් කළ යුතුය. ඒ සඳහා ඔහුට 38 වැනි වගන්තිය යටතේ පත් කරනු ලබන ස්ථාපන කමිටුවේ සහය ලබාගත හැකි ය.

**ස්ථාපන කමිටුව.**

38.1. ස්ථාපන කමිටුව නිල බලයෙන් පවත්වන පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය :—

(අ) පළාත් පරිවාස කොමසාරිස්වරයා ස්ථාපන කමිටුවේ සභාපතිවරයා විය යුතුය,
(ආ) පළාත් මූලස්ථාන පරිවාස නිළධාරි,
(ඇ) ස්ථානභාර පරිවාස නිළධාරි,
(ඈ) ස්ථානභාර මේට්‍රන්,
(ඉ) සහකාර මේට්‍රන්.

38.2. ස්වෙච්ඡා ළමා නිවාසයක සිටින ළමයකු භාරගන්නා නිවාසයකට මාරු කිරීමේදී නිවාසයේ කළමණාකරු පළාත් පරිවාස කොමසාරිස්වරයාගේ නියෝග පරිදි ක්‍රියා කළ යුතු ය.

38.3. ස්වෙච්ඡා ළමා නිවාසයක සිටින ළමුන් සම්බන්ධයෙන් සෑම තුන් මසකට වරක්ම පළාත් පරිවාස කොමසාරිස්වරයාගේ හෝ ඔහු බලය පවරන ලද නිලධරයකුගේ සහභාගීත්වයෙන් ස්ථාපන කමිටුවක් ක්‍රියාත්මක කළ යුතු ය.

ළමයෙකු දූෂණය කිරීම හෝ පැහැර නොගෙන යුතු බව.

39. ළමා නිවාසයක හෝ ළමයින් භාරගන්නා පළාත් නිවාසයක සිටින කවර හෝ ළමයකු නිවාසයේ කළමණාකරු විසින් හෝ එහි කාර්ය මණ්ඩලයේ කිසිවකු විසින් හෝ දූෂණය කිරීම හෝ පැහැරගෙන යාම, කෲරත්වයට භාජනය කිරීම, සමච්චලයට භාජනය කිරීම, දැඩි ලෙස සේවයෙහි යොදවා ගැනීම වැනි අනිසි බලපෑමකට ලක් නොකළ යුතු ය.

වැරදි.

40.1. යම් තැනැත්තෙකු විසින් —

(අ) මේ ප්‍රඥප්තිය යටතේ කරන ලද යම් නියෝගයක් අනුව සැපයිය යුතු යම් තොරතුරක් හෝ වාර්තාවක් ඉදිරිපත් කිරීම පැහැර හරින ලද අවස්ථාවක දී ; හෝ

(ආ) සපයනු ලබන තොරතුරක් හෝ වාර්තාවක දැනුවත්ම ව්‍යාජ ප්‍රකාශ ඇතුළත් කරන ලද අවස්ථාවක දී ; හෝ

(ඇ) මේ ප්‍රඥප්තියේ විධිවිධාන හෝ ඒ යටතේ කරන ලද යම් නියෝගයක් හෝ විධිවිධාන හෝ කඩ කරන ලද අවස්ථාවක දී

ඒ තැනැත්තා මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු වන්නේ ය.

40.2. මේ ප්‍රඥප්තිය යටතේ වරදක් කරන තැනැත්තෙකු ඒ වෙනුවෙන් වෙනත් විශේෂිත දඩුවමක් පැනවීමට විධිවිධාන සලසා නොමැති නම්, වරදකට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයෙක් ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්දහසකට නොඅඩු දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඩුවම් දෙකටම ඒ තැනැත්තා යටත් විය යුතුය. එසේ දඩුවම් ලැබූ ආයතනවල කළමණාකාරිත්වය අසාධු ලේඛනයට ඇතුළත් කරනු ලබන්නේ ය.

40.3. පුද්ගල මණ්ඩලයක් විසින් මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන ලද අවස්ථාවක දී —

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම් ඒ සංස්ථාවේ එක් එක් අධ්‍යක්ෂකවරුන් ද නිළධාරීන් ද,

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම් එම ව්‍යාපාර ආයතනයේ එක් එක් හවුල්කරුවන් ද,

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය ළමා නිවාසයේ කළමණාකරණ මණ්ඩලය වන්නේ නම්, එහි එක් එක් සාමාජිකයෙකු ම ද

වරදකට වරදකරු වන්නේ ය.

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට අරමුදල් වෙන්කර දීම.

41.1. මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් මුදලක් ඌව පළාත් සභාව විසින් වාර්ෂිකව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට වෙන් කර සපයා දිය යුතු ය.

41.2. මධ්‍යම රජය හෝ වෙනත් අංශවලින් පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවට සපයන අරමුදල් මේ ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කිරීම සඳහා යොදා ගත හැකි ය.

41.3. භාරගන්නා නිවාසයකට දේශීය සංවිධාන හෝ පුද්ගලයන්ගෙන් ලැබෙන සියළුම අරමුදල් හා විදේශීය සංවිධාන වලින් හෝ විදේශයෙන් ලැබෙන සියළු අරමුදල් සම්බන්ධයෙන් ලේඛන නඩත්තු කළ යුතු අතර එවැනි වාර්තා මාස්පතා පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එකී අරමුදල් පිළිබඳව පරීක්ෂා කිරීමේ බලය පළාත් පරිවාස කොමසාරිස්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකුට හිමි විය යුතු ය.

නඩත්තු ගෙවීම.

42.1. මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කර ඇති ළමා නිවාසයක ආරක්ෂාව සැලසෙන සෑම ළමයෙකුගේම නඩත්තුව වෙනුවෙන් වාර්ෂිකව ගණනය කරනු ලබන මුදලක් අදාළ නිවාසයේ කළමනාකරු වෙත පළාත් පරිවාස කොමසාරිස්වරයා විසින් ගෙවිය යුතු ය.

42.2. නිවාසයක පවත්වාගෙන යනු ලබන ස්වෙච්ඡා සංවිධානයේ මහ සභා රැස්වීමක දී වාර්ෂික පත් කරනු ලබන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වූ විගණකවරයකු විසින් ළමා නිවාසයේ වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතුය. මේ ගිණුම් ප්‍රකාශය සෑම වසරකම මාර්තු මස පළමුවන දින හෝ ඊට පෙර කළමණාකරු විසින් පළාත් පරිවාස කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

නියෝග.

43.1. පරිවාස හා ළමාරක්ෂක සේවා විෂය භාර අමාත්‍යවරයා විසින් මේ ප්‍රඥප්තියේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම් සඳහා නියෝග සෑදිය හැකි අතර එය පළාත් සභාවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

43.2. එසේ අනුමත නොකරන ලද එවැනි නියෝගයක් එම අනුමතයේ දින සිට පරිච්චින්න කරන ලද ලෙස සලකනු ලැබිය හැකි නමුත්, ඒ යටතේ කලින් කරන ලද යම් දෙයකට ඉන් අගතියක් නොවිය යුතු ය.

මුදල් වර්ෂය සහ විගණනය.

44. මුදල් වර්ෂය ලිත් වර්ෂය වන අතර මෙම දෙපාර්තමේන්තුවේ ගිණුම් කටයුතු විගණකාධිපති දෙපාර්තමේන්තුව හා ඌව පළාත් සභාවේ අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ මගින් විගණනයට භාජනය කළ යුතු අතර 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23 වැනි වගන්තියට අනුකූල විය යුතු ය.

අර්ථ නිරූපණය.

45. මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස —

"පළාත් සභාව" යන්නෙන් ඌව පළාත් සභාව අදහස් වන්නේ ය.

"ඌව පළාත්" යන්නෙන් බදුල්ල සහ මොනරාගල පරිපාලන දිස්ත්‍රික්ක අයත් පාලන ප්‍රදේශ අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ඌව පළාත් ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක විෂයභාර අමාත්‍යවරයා අදහස් වේ.

"කොමසාරිස්වරයා" යන්නෙන් ඌව පළාත් සභාවේ පරිවාස හා ළමාරක්ෂක හෝ දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා අදහස් වේ.

"පැහැර ගැනීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"දූෂණය" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ ඊට දී ඇති අර්ථයම ඇත්තේ ය.

"අත්හළ" යන්නට අනත්දරු නිවාස ආඥාපනතෙහි (142 වැනි පරිච්ඡේදයේ වූ) ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

"ස්ථාපනය කිරීමේ කමිටුව" යන්නෙන් ළමා නිවාසයක හෝ ළමයින් භාර ගන්නා පළාත් නිවාසයක නේවාසිකව සිටින ළමයකු, ඔහුගේ දෙමාපියන්, භාරකරුවන්, ඥාතිවරයකුට හෝ සුදුසු පුද්ගලයකු වෙත භාරදීම හෝ එම දරුවාගේ යහපත තකා අන් අයුරකින් සමාජගත කිරීම අදහස් කෙරේ.

වචනාර්ථ.

46. මෙම ප්‍රඥප්තියේ සිංහළ, දෙමළ හා ඉංග්‍රිසි වචනාර්ථ අතර හෝ පාඨ අතර යම් අනනුකූල අවස්ථාවක් ඇති වුවහොත් සිංහල වචනාර්ථය හා පාඨාර්ථය බල පැවැත්විය යුතු ය.

*ඇමුණුම් අංක 01*

**ස්වේච්ඡා ළමා නිවාසවල සේවා තත්වය නගාසිටුවීම සඳහා පොදු මට්ටම් නියම කිරීම**

ස්වේච්ඡා ළමා නිවාසවලට ඇතුළත් කරනු ලබන අනාථ, අත්හළ හා අසරණ ළමයින්ගේ ආරක්ෂාව, රැකවරණය හා ශුභ සිද්ධිය සලසමින් නොයෙක් දුෂ්කරතා මධ්‍යයේ එම නිවාස පවත්වාගෙන යාමෙන් ස්වේච්ඡා සංවිධාන විසින් කරනු ලබනුයේ උදාර සේවාවකි. රජයේ ආධාර ද ඇතිව මෙම ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වා ගෙන යන ස්වේච්ඡා ළමා නිවාසවල අඩුම වශයෙන් තිබිය යුතු සේවා මට්ටම් තීරණය කර, එම සේවා තත්වයන් තවදුරටත් නගා සිටුවීමේ අවශ්‍යතාව ගැන ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් පත්කළ කමිටුවකින් නිර්දේශ කර, අනුමත වී ඇති බැව් හා පොදු මට්ටම් පහත දක්වනු ලැබේ.

ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් නඩත්තු ආධාර හා යථායෝග්‍ය ආධාර අනුමත කිරීමේදී සෑම ළමයෙකුටම උපරිම සේවයක් ඉටු කිරීමට උපයෝගී වන මේ පොදු මට්ටම් පවත්වාගෙන යාම ගැන ද සැලකිලිමත් වන බැවින්, අදාළ සේවා මට්ටම් සම්පූර්ණ කිරීමට ඉතා ඉක්මනින් අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව දන්වමි.

01. *ගොඩනැගිලි හා වටපිටාව පිළිබඳ මට්ටම් —*

1.1 එක් ළමයකුට වර්ග අඩි 36 ක් වන පරිදි නිදා ගැනීමේ ඉඩකඩ ගොඩනැගිලිවල තිබිය යුතු ය.

1.2 තවද කෑම අනුභවයට, පාඩම් කිරීමට, විවේක ගැනීමට හා අමුත්තන් මුණ ගැසීමට උපරිම ළමයින් සංඛ්‍යාවට සරිලන පරිදි ඉඩකඩ, නිදා ගැනීමේ ඉඩකඩවලට අමතරව ගොඩනැගිලිවල තිබිය යුතු ය.

1.3 නිවාසයට අවශ්‍ය හිරු එළිය සහ වාතාශ්‍රය ලැබීම සඳහා දොර ජනෙල් වර්ග ප්‍රමාණයෙන් 1/7 ක් වන පරිදි තිබිය යුතු ය.

1.4 සේවකයින්ට අවශ්‍ය ඉඩකඩ වෙන ම තිබිය යුතු ය.

1.5 ගොඩනැගිලි පිරිසිදුවත්, අලංකාරවත් තබාගත යුතු අතර අවට ගෙවත්ත නිවාසයට ප්‍රයෝජනවත් වන පරිදි හා සිත් ගන්නා පරිද්දෙන් පවත්වාගෙන යා යුතු ය.

1.6 නිවාසයේ අවශ්‍යතාවන්ට සෑහෙන පරිදි ජලය සැපයීමේ විධිවිධාන තිබිය යුතු ය.

1.7 ජලය සපයනු ලබන්නේ ළිඳකින් නම් එය ආරක්ෂා සහිත විය යුතු ය.

1.8 ළමුන්ට හා සේවකයින්ට සෑහෙන පරිදි ආරක්ෂාව හා රැකවරණය ඇතිව නෑමට පහසුකම් තිබිය යුතු ය.

1.9 සෑම නේවාසිකයන් 10 දෙනෙකුට එක වැසිකිළියක් බැගින් තිබිය යුතු ය.

1.10 විෂබීජ නාශක බෙහෙත් යොදා නිතරම වැසිකිළි හා කාණු සුද්ධ පවිත්‍ර කිරීමට විධිවිධාන යෙදිය යුතු ය.

1.11 මුළු නිවාසයේ ම අවශ්‍යතාවන්ට සෑහෙන පරිදි රාත්‍රි ආලෝකය සැපයිය යුතු ය.

1.12 භූමිතෙල් ලාම්පු පාවිච්චි කරන්නේ නම් ආරක්ෂා සහිත ලාම්පු යොදා ගත යුතු ය.

02. *ආහාර පාන පිළිබඳ මට්ටම් :*

2.1 නේවාසිකයින්ට සපයන ආහාර සමබර හා පෝෂ්‍යදායී විය යුතු අතර, නියමිත ප්‍රමාණයන්ගෙන් විය යුතු ය.

2.2 ඒ ඒ වයස් ප්‍රමාණ අනුව ආහාර සටහන් සකස් කර තිබිය යුතු ය.

2.3 එදිනෙදා දෙනු ලබන ආහාර වර්ග සහ ප්‍රමාණය දැක්වෙන ලේඛනයක් තබාගත යුතු ය.

2.4 යටත් පිරිසෙන් සතියට අවශ්‍ය වන හාල්, පොල්, සීනි, පිටි හා තුන පහ ආදියත්, දින 03 කට සෑහෙන එළවළු ප්‍රමාණයක් සෑම විටෙක ම ගබඩා කර තිබිය යුතු ය.

03. *ළමයින්ගේ ඇඳුම් පිළිබඳ මට්ටම් :*

3.1 සෑම ළමයකුට ම පොරෝනයක් හා තුවායක් බැගින් සපයා තිබිය යුතු ය.

3.2 සෑම ළමයකුට ම නිවාසයේදී ඇඳීමට ඇඳුම් කට්ටල 02 ක් ද, පාසල් යන ළමයකුට පාසලට ඇඳීමට ඇඳුම් කට්ටල 03 ක් ද, උත්සව ආදියට ඇඳීමට සුදුසු හොඳ තත්වයේ ඇඳුම් කට්ටලයක් ද අඩු වශයෙන් තිබිය යුතු ය.

3.3 ළමයින් යන පාසල් සඳහා පිළිගත් අවශ්‍යතාව අනුව සපත්තු හා මේස් සපයා තිබිය යුතු ය.

04. *උපකරණ පිළිබඳ මට්ටම් :*

(අ) *ගෘහ භාණ්ඩ :*

4.1 අවුරුදු 06 න් ඉහළ සෑම ළමයෙකුටම ඇඳුම්, පොත් ආදී පෞද්ගලික භාණ්ඩ තබා ගැනීමට වෙනම කබඩ් එකක් බැගින් තිබිය යුතු ය.

4.2 අවුරුදු 06 න් පහළ ළමයින්ගේ ඇඳුම් හා අනෙකුත් උපකරණ තබා ගැනීම සඳහා පොදු වශයෙන් අල්මාරි තිබිය යුතු ය.

4.3 සෑම ළමයකු සඳහාම නිදා ගැනීමට ඇඳක් නොමැති නම් යටත් පිරිසෙන් පැදුරක් හෝ කැන්වස් එකක් හා කොට්ටයක් තිබිය යුතුය. ත්‍යාගශීලීන්ගේ ආධාර මත හෝ හැකි ඉක්මනින් ළමයින්ට ඇඳක් සපයා දීමට උත්සහ කළ යුතු ය.

4.4 නේවාසික සංඛ්‍යාවට සෑහෙන තරම් භෝජන ගැනීමට හා/හෝ කියවීම් ශාලාවට අවශ්‍ය පුටු මේස තිබිය යුතු ය.

(ආ) *පිඟන් කෝප්ප :*

4.5 අවුරුදු 01 න් ඉහළ සෑම ළමයකුට ම පහසුවෙන් පිරිසිදු කරගත හැකි පිඟානක් හෝ කෝප්පයක් තිබිය යුතු ය.

4.6 ළදරුවන් සඳහා කිරි බෝතල් හා අවශ්‍ය සූප්පු තිබිය යුතු ය.

4.7 සියලුම නේවාසිකයින්ට හා නිලධාරීන්ට සෑහෙන පරිදි පොදු බඩු හා කුස්සියේ උපකරණ තිබිය යුතු ය.

(ඇ) *අධ්‍යාපනික උපකරණ :*

4.8 ළමයින් යන පාසල් වලින් නියම කරනු ලබන පොත්පත් හා උපකරණ ළමයින්ට සපයා තිබිය යුතු ය.

4.9 ළමයින්ට විවේක කාලයේ කියවීමට අවශ්‍ය පරිදි පුස්තකාල පහසුකම් තිබිය යුතු ය.

4.10 දිනපතා පුවත්පත් හා සතිපතා නිකුත් වන ළමා පුවත්පත් සැපයීමට විධිවිධාන තිබිය යුතු ය.

4.11 විනෝදාත්මක කටයුතුවලට අවශ්‍ය වන උපකරණ අවශ්‍යතාවලට සෑහෙන පමණ සපයා තිබිය යුතු ය.

(ඈ) ළමුන්ගේ සහජ හැකියාවන් දියුණු වන පරිදිත්, විවේක කාලය මැනවින් ප්‍රයෝජනයට ගත හැකිවන පරිදිත් පහත සඳහන් උපකරණ සපයාදීම ඉතා වැදගත් ය.

4.12 ගුවන් විදුලි යන්ත්‍රයක්.

4.13 සංගීත භාණ්ඩ.

4.14 අවුරුදු 03 න් පහළ සෑම ළමයකුටම යටත් පිරිසෙන් එක් එක් සෙල්ලම් බඩුව බැගින් තිබීම.

4.15 ළමුන්ගේ රුචිකත්වයන් අනුව විවේක කාලය ගත කිරීම සඳහා අවශ්‍ය උපකරණ.

(ඉ) *ක්‍රීඩා පහසුකම් හා උපකරණ :*

4.16 සෑම නිවාසයකම නේවාසික සංඛ්‍යාව සඳහා බාහිර ක්‍රීඩා කිරීමට සෑහෙන තරමේ ක්‍රීඩා පිටියක්වත් තිබිය යුතු ය.

4.17 නිවාසය සතු ක්‍රීඩා පිටියක් නොමැති නම් ඊට පිටස්තරව ඇති පොදු හෝ පාසල් ක්‍රීඩාංගන ප්‍රයෝජනයට ගැනීමට විධිවිධාන යොදාගෙන තිබිය යුතු ය.

4.18 නිවාසයට සෑහෙන බාහිර ක්‍රීඩා උපකරණ ලබාගෙන තිබිය යුතු ය.

4.19 නිවාසයට සෑහෙන ගෘහස්ථ ක්‍රීඩා උපකරණ ලබාගෙන තිබිය යුතු ය.

05. *සේවා මට්ටම් :*

නිවාස ගතව සිටින ළමුන්ගේ ආරක්ෂාවත්, රැකවරණයත් සලසා ඔවුන්ගේ ශුභසිද්ධියට අදාළ කටයුතු කෙරෙන පරිදි ළමා නිවාසයේ සේවාවන් පහත සඳහන් පරිදි ඉටුවිය යුතු ය :—

(අ) පාලන කමිටුව :

5.1 යටත් පිරිසෙන් මසකට වරක් පාලන කමිටුව රැස්විය යුතු අතර 03 මසකට වරක් රැස්වීම ළමා නිවාසයේම පැවැත්විය යුතුය.

5.2 ළමා නිවාසයේ නඩත්තුවට අවශ්‍ය වන අරමුදල් සපයා ගැනීම, පාලනය හා ළමුන්ගේ ස්ථාපන කටයුතු ගැන ක්‍රමවත් සැලසුම් පිළියෙල කර තිබිය යුතු ය.

5.3 දෙපාර්තමේන්තුවේ නියමයන් හා උපදෙස් අනුව නිවාසය පවත්වාගෙන යාම හා වරින් වර සැපයිය යුතු වාර්තා නොකඩවා සැපයීමට අවශ්‍ය විධිවිධාන තිබිය යුතු ය.

5.4 කළමනාකරු හා සේවක මණ්ඩලය යහපත් චරිතයකින් හෙබි අය විය යුතු ය.

5.5 දෙපාර්තමේන්තුවෙන් දෙන ලද යථායෝග්‍ය හා නඩත්තු ආධාර නියමිත පරිදි වැය කිරීම හා වාර්ෂිකව රජයේ ආධාර ගෙවීමට පෙර කළමනාකරු විසින් පිළිගත් ගණන් පරීක්ෂකවරයකු ලවා සහතික කරවා ගත් ගිණුම් වාර්තාවක් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට විධිවිධාන යොදා තිබිය යුතුය. මේ සඳහා ලියාපදිංචි කරන ලද ගණන් පරීක්ෂකවරයකු සොයා ගැනීමට අපහසුකමක් තිබේ නම් සිවිල් ලැයිස්තුවේ නම් සඳහන් නිළධාරියකු ලවා එම කාර්යය කරවාගත යුතු ය.

5.6 පහත සඳහන් ලේඛන නිවාසයේ තබාගත යුතු ය : —

- ඇතුළත් කිරීමේ ලේඛනය,
- දිනපතා පැමිණීමේ ලේඛනය,
- ගිණුම් පොත්,
- ලොග් පොතක් (දෙපාර්තමේන්තුවේ නිළධාරින් සඳහා),
- අමුත්තන්ගේ පොත,
- නේවාසිකයින් සඳහා ලිපිගොනු (එක් එක් නේවාසිකයකු සඳහා වෙනම ලිපිගොනු),
- බඩු වට්ටෝරු පොත,
- ආහාර සටහන් පොත.

5.7 දෙපාර්තමේන්තුවෙන් දෙන ලද සෑම භාණ්ඩයක්ම හා උපකරණයක්ම බඩු වට්ටෝරු පොතට ඇතුළත් කිරීම හා වාර්ෂිකව ඒවා සමීක්ෂණයට භාජනය කර තිබිය යුතු ය.

(ආ) කාර්ය මණ්ඩල මට්ටම් :

(ළමා නිවාසයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම දෙපාර්තමේන්තුවෙන් සංවිධානය කරන පුහුණුවීම් පාඨමාලාවට සහභාගී විය යුතුය. 1987 අවසානයට පෙර සෑම නිවාසයකම භාරකාර මාතාව/පියා, උප භාරකර මාතාව/පියා මේ පුහුණුව ලත් අය විය යුතුයි.)

5.8 සෑම ළමා නිවාසයකම පුහුණුව ලත් භාරකාර මවක/පියකු සිටිය යුතුයි. භාරකාර මවට/පියාට දෙපාර්තමේන්තු පුහුණුවට අතිරේකව පහත දැක්වෙන සුදුසුකම් තිබිය යුතු යි :—

(i) අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්වීම (දැනට සිටින අයට අදාල නොවේ)

(ii) වයස අවු. 25 ට වැඩිවීම (ළමා කටයුතු සම්බන්ධයෙන් සුදුසු පුහුණුවක් තිබීම)

(iii) යහපත් කල්ක්‍රියාවකින් යුක්තවීම.

5.9 හැම භාරකාර මාතාවක/පියෙකුම ළමා නිවාසයේම පදිංචි වී සිටිය යුතු ය.

5.10 අවුරුදු 02 ට අඩු සෑම ළමයින් 05 දෙනෙකු සඳහාම එක නිවාස මාතාවක් බැගින් සිටිය යුතු ය.

5.11 වයස අවුරුදු 2 - 6 දක්වා ළමුන් 10 දෙනෙකුට නිවාස මාතාව බැගින් සිටිය යුතු ය.

5.12 වයස අවුරුදු 6ට ඉහල ළමුන් 25 දෙනෙකුටම භාරකාර මාතාවක/පියකු හා උප නිවාස මාතාවක/නිවාසාචාර්යයකු බැගින් සිටිය යුතු ය.

නිවාස මාතා/නිවාසාචාර්යවරයකුට තිබිය යුතු සුදුසුකම් :—

(i) 8 වැනි ශ්‍රේණිය සමත්වීම (දැනට සිටින අයට අදාල නොවේ) ;

(ii) වයස අවුරුදු 21 ට ඉහළ වීම. (නිවාසයේ වැඩිහිටි ළමුන් මේ සඳහා යොදාගන්නේ නම් වයස අවුරුදු 18 සම්පූර්ණ විය යුතුය) ;

(iii) යහපත් කල් ක්‍රියාවෙන් යුක්තවීම :

මීට අමතරව කෑම පිසීම, වටපිටාව පිරිසිදු කිරීම යනාදියට අවශ්‍ය සේවක සේවිකාවන් පත්කර ගත යුතුය. මුර වැඩ හෝ වතු සඳහා ස්ථිර සේවකයෙකු යොදවා ගන්නේ නම් මනා චරිතයකින් හෙබි වයස අවුරුදු 45 ට වැඩි අයෙකු විය යුතු ය.

(ඇ) අතිරේක සේවා පහසුකම්වල මට්ටම් ඃ

5.13 ළමා නිවාසය පිහිටුවිය යුත්තේ සෞඛ්‍යය හා වෛද්‍ය සේවා මධ්‍යස්ථාන නුදුරින් ඇති ස්ථානයක ය.

5.14 ළමයින්ගේ සෞඛ්‍යය හා වෛද්‍ය අවශ්‍යතා ගැන වරින්වර ළමා නිවාසයට පැමිණ පරීක්ෂාවට ලක් කිරීමටත්, එම මධ්‍යස්ථානවලට ළමයින් ගෙන ගොස් ප්‍රතිකාර ලබා ගැනීමටත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ හෝ පෞද්ගලික වෛද්‍යවරයකු සමග අවශ්‍ය විධිවිධාන යොදා ගෙන තිබිය යුතු ය.

5.15 ළමයින්ට අවශ්‍ය ප්‍රතිශක්තිකරණ එන්නත් කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කර තිබිය යුතු ය.

5.16 උප්පැන්න සහතික නොමැති ළමයින් කොට්ඨාස භාර පරිවාස නිළධාරීන් මගින් ළගම සිටින රජයේ වෛද්‍යවරයකුට පෙන්නා අනුමාන වයස් සහතිකය ලබාගෙන තිබිය යුතු ය.

5.17 ළමා නිවාසයකට ඇතුළත් කිරීමේදී සෑම ළමයකු වෙනුවෙන්ම වෛද්‍ය වාර්තාවක් ලබා ගත යුතු අතර, සෑම ළමයකුම වාර්ෂික වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කොට ඒ බව එම ළමයාගේ පෞද්ගලික ලිපි ගොනුවේ සටහන් කර තැබිය යුතුය. ළමයාගේ උස, බර, හඳුනා ගැනීමේ ලකුණු ආදිය ගැනත් එහි සටහන් තැබීමට විධිවිධාන යොදා තිබිය යුතුයි.

5.18 වෛද්‍ය වාර්තාව අනුව මන්දපෝෂණයෙන් පෙළෙන ළමයින් පෝෂණ මධ්‍යස්ථානවලට යැවීම සඳහා සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා කටයුතු කර තිබිය යුතු ය.

*(ඇ) අධ්‍යාපන සේවා මට්ටම් :*

5.19 වයස අවුරුදු 06 වැඩි සෑම ළමයකුම පිළිගත් පාසලකට යැවීමට කටයුතු කර තිබිය යුතු යි.

5.20 වයස අවුරුදු 06 ට අඩු හා 03 ට වැඩි ළමයින් සියලු දෙනාම කිට්ටු පූර්ව පාසල් පන්තිවලට යැවීමට හෝ ඔවුන් වෙනුවෙන් එවැනි පන්ති පැවැත්වීමට විධිවිධාන යොදා තිබිය යුතු යි.

5.21 ළමා නිවාස කාල සටහනේ දිනපතාම පාඩම් කිරීමට හා ක්‍රීඩා කිරීමට සෑහෙන කාලයක් වෙන්කර තිබිය යුතු යි.

5.22 ළමයින්ට කිසියම් වෘත්තීය පුහුණුවක් ලබාදීමට වැඩ පිළිවෙල යොදා තිබිය යුතු යි.

5.23 විශේෂයෙන් වයස අවුරුදු 14 ඉක්ම වූ පාසල් අධ්‍යාපනයෙන් සාර්ථක ප්‍රතිඵල නෙළා ගැනීමට නොහැකි හෝ විශේෂ වෘත්තීය කෙරෙහි ළැදියාවක් හෝ දක්ෂතාවයක් ඇති ළමයින් සඳහා වෘත්තීය පුහුණුවක් ලබාදීමට වැඩපිළිවෙලක් සකස් වී තිබිය යුතුයි. දෙපාර්තමේන්තුවේ ආධාර ඇතිව ආරම්භ කර ඇති විශේෂ වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථාන තිබෙන ළමා නිවාසවලට ඊට සුදුසු ළමයින් යැවීම සඳහා කොට්ඨාස භාර සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් ලබාගත හැකිය.

එම මධ්‍යස්ථානවල නාම ලේඛනයක් මේ සමග ඇති 2 ඇමුණුමේ ඇත.

*(ඉ) ළමයින්ගේ වර්ධනයට අදාළ විශේෂ සේවා :*

5.24 නිවාස ගත කිරීමේදී එක් එක් ළමයා වෙනුවෙන් සටහන් තැබෙන පරිදි පෞද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යා යුතුය. මෙම සටහනෙහි දුර්වල ළමයින් පිළිබඳව මසකට වරක් හා අනෙකුත් ළමයින් පිළිබඳව 06 මසකට වරක් සටහන් තැබිය යුතුය. ඒ ඒ ළමයා පිළිබඳ ලිපිගොනුවල පහත සඳහන් දේ ඇතුළත් විය යුතු ය.

5.25 උප්පැන්න සහතිකය හා පාඨශාලා සහතික, සහල් සලාක පොත් තිබේ නම් ඒ පිළිබඳ සටහන් ගොනුවේ සඳහන් කර තිබිය යුතු අතර, උප්පැන්න සහතිකය නොමැති නම් අනුමාන වයස් සහතික ලබා ගැනීමටත්, සහල් සලාක පොත් නොමැති නම් සලාක පොත් ලබා ගැනීමටත් නිවාස භාර ප.නි. සමග ක්‍රියා කර තිබිය යුතු ය.

5.26 ළමයාගේ උස, බර හා වෙනත් වෛද්‍ය තොරතුරු සටහන් කළ යුතුයි. (අවු. 02 කට අඩු ළමුන් සම්බන්ධයෙන් හය මසකට වරක්)

5.27 ළමයාගේ ශාරීරික, මානසික, අධ්‍යාත්මික පැවැත්ම ගැන සටහන් තබා තිබිය යුතු ය.

5.28 දෙමාපිය භාරකාරාදීන් හමුවීම ගැන සටහන් තබා තිබිය යුතු යි.

5.29 ස්ථාපන කමිටු විශේෂ තීරණ ගැන සටහන් තබා තිබිය යුතු යි.

5.30 ප්‍රතිශක්තිකරණ දිනයන් - හැසිරීම සම්බන්ධයෙන් කිසියම් ප්‍රශ්නයක් උද්ගත වූ විට ඒ පිළිබඳ පරිවාස නිලධාරින් හා සාකච්ඡා කොට, අවශ්‍ය නම් විශේෂ ප්‍රතිකාර ලබාදීමේ වැඩ පිළිවෙලක් සකස් කර ඒ පිළිබඳ විස්තර සටහන් තබා තිබිය යුතු ය.

06. *ස්ථාපනය කිරීම :*

නිවාස ගත කරනු ලබන සෑම ළමයකුටම අවශ්‍ය ආරක්ෂාව හා රැකවරණය සැලසීමටත්, හැකිතාක් ඉක්මනින් ළමයා නැවත සමාජයට අන්තර්ග්‍රහණය වන පරිදි ස්ථාපනය කිරීමටත් ළමා නිවාසයේ පාලන කමිටුව හැකි සෑම උත්සහයක්ම දැරිය යුතුය. නිවාසගතව සිටින කාලසීමාව කෙටි කිරීම එක අතකින් ළමයාගේම ශුභසිද්ධියට හේතුවන අතර අනෙක් අතට අලුතෙන් නිවාස ගත කළ යුතු ළමයින් සංඛ්‍යාව දිනෙන් දින වැඩි වන නිසා ඔවුන්ට ඉඩ සැලසෙන පරිදි කටයුතු කිරීමටත් මෙයින් පහසු වනු ඇත. ස්ථාපනය යනුවෙන් අදහස් කරන්නේ නේවාසික ළමයින් පිළිබඳ වරින්වර සමාලෝචනය කොට පහත දැක්වෙන අන්දමකින් හෝ ඔවුන්ගේ අනාගත ශුභසිද්ධිය සැලසෙන පරිදි කටයුතු සැලසුම් කිරීම ය.

6.1 දෙමව්පිය භාරකාරාදීන් සිටින හෝ සොයා ගත හැකි සෑම ළමයකුම විශේෂ අපහසුකම් නොමැති නම් ඔවුන් වෙත ආපසු භාරදීම.

6.2 දෙමව්පිය භාරකරු ආදීන් සිටියත් ඔවුන්ට ළමයා ගැන කටයුතු කිරීමට නොහැකි අවස්ථාවන්හි දී ඒ සඳහා වෙනත් සුදුසු පුද්ගලයන් යටතේ රැඳවීම.

6.3 අනාථ, අත්හළ සහ අසරණ දරුවන් හෝ දෙමව්පියන්ගේ ලිඛිත කැමැත්ත ලැබී ඇති සුදුසු දරුවන් නීත්‍යානුකූලව දරුකමට හදාවඩා ගැනීමට දීම.

6.4 කෙටි කාලීනව හෝ දීර්ඝ කාලීනව ළමයකුගේ අභිවෘද්ධිය සැලසෙන අයුරින් පෝෂක දෙමව්පියන් වෙත භාරදීම.

6.5 ළමයකුගේ අභිවෘද්ධිය සැලසෙන අයුරින් ළමයාට ආධාර සැපයිය හැකි කැපකරු දෙගුරුන් තෝරා දීම.

6.6 රැකියා සපයා දීම.

6.7 රැකියාවක් කිරීමට හැකිවන පරිදි කිසියම් වෘත්තීය පුහුණුවක් ලබාදීම.

6.8 විවාහ කරදීම.

6.9 දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නිවාස ගතකර ඇති ළමුන් වෙනත් ළමා නිවාසයකට මාරු කිරීම හෝ කුමන ක්‍රමයකින් හෝ නිවාසයෙන් බැහැර කිරීමට ප්‍රථම පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. මුළු කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් අයගෙන් යුත් ස්ථාපන කමිටු රැස්වීම හය මසකට වරක් පවත්වා එහිදී ගන්නා ලද තීරණ අනුව එක් එක් ළමයා සම්බන්ධයෙන් ක්‍රියා කර තිබිය යුතු ය.

(i) ප්‍රදේශයේ පරි.ළ.සේ.ස.කො/නිවාස භාර ප.නි.

(ii) පාලක මණ්ඩලයේ කළමනාකාර/නියෝජිතයෙක්

(iii) නිවාසයේ භාරකාර/නිවාසාචාර්ය

නිවාසගත කර ඇති ළමුන්ගේ අවු. 03 කට වැඩියෙන් නිවාසයේ තබාගත යුතු යැයි ස්ථාපන රැස්වීමෙන් තීරණය කරන ළමුන් පිළිබඳව එම අවුරුදු 03 ඉක්ම යාමට මාස 03 කට පෙර පරි.ළ.සේ.කො. ට දන්වා අනුමැතිය ලබාගත යුතුය. එසේ නොකළහොත් ඔවුන් සඳහා නඩත්තු ආධාර ගෙවනු නොලැබේ.

07. *පොදු කරුණු :*

7.1 සෑම නිවාසයකම ඒ ඒ ළමයින්ගේ ආගම ඇදහීමට සුදුසු වාතාවරණයක් සහ වැඩපිළිවෙලක් සකස් කර තිබිය යුතු ය.

7.2 මාස කීපයකට වරක් ළමයින් සියලු දෙනාම ලොකු හෝ කුඩා කණ්ඩායම් වශයෙන් අධ්‍යාපන/විනෝද ගමන් සඳහා ගෙන යැමට වැඩ පිළිවෙලවල් යෙදීම සුදුසුය. (මේ වැඩසටහන සමාජ සේවා විද්‍යාලයේදී කරන ලද පාඨමාලාවේදී ඇති උපදෙස් අනුව සකස් කිරීම වඩාත් යෝග්‍යය. මේ ක්‍රමය යටතේ ළමා නිවාසය අවට හෝ ඈත දුර ප්‍රදේශවල අධ්‍යාපනික හෝ සංස්කෘතික වටිනාකම් ඇති ස්ථාන නැරඹීමට ළමයින් ගෙන යා හැකිය.)

7.3 සෑම නිවාසයකම බාලදක්ෂ/දක්ෂිකා කණ්ඩායම් පවත්වාගෙන යාම සුදුසු ය.

7.4 ළමයින්ගේ දෙමව්පිය භාරකාරාදීන් සමග සම්බන්ධතා වැඩිවන පරිදි වැඩසටහන් සකස් කර තිබිය යුතු ය.

7.5 ළමා නිවාසයේ කටයුතු වරින්වර පරීක්ෂා කර නිසි උපදෙස් දීම සඳහා උපදේශක කමිටුවක් පත්කිරීමට පරිවාස හා ළමාරක්ෂක කටයුතු විෂය භාර ඇමතිතුමාට ව්‍යවස්ථාපිත බලය ඇත. ඒ සඳහා ළමා සුභසාධනය ගැන දැනුමක් හා ළමා නිවාසයේ කටයුතු ගැන උනන්දුවක් දක්වන බාහිර දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් යුතු අයගේ නම් මේ සඳහා කොට්ඨාසයේ සහකාර කොමසාරිස් මගින් මා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු අතර, ඔවුනට නිවාසයේ කටයුතු සොයා බලා උපදෙස් ඉදිරිපත් කිරීමට පහසුකම් සලසා තිබිය යුතු ය.

7.6 ළමා නිවාසයට දේශීය හෝ විදේශීය ආධාර වශයෙන් ලැබෙන සියලුම මුදල් හා භාණ්ඩ යථා පරිදි ගිණුම් පොත්වල සටහන් කර තැබිය යුතු ය.

7.7 ස්වේච්ඡා ළමා නිවාස විදේශීය ආයතන සමග කිරීමට බලාපොරොත්තු වන සියලුම ගනුදෙනු හා සම්බන්ධකම් ගැන මාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු අතර, දැනට පවත්වාගෙන යන එවැනි සම්බන්ධකම් ගැන මා වෙත වාර්තා කළ යුතු ය.

7.8 නේවාසිකයන්ගේ වගකීම් හා යුතුකම් ගැන හැඟීම් වැඩි දියුණු කිරීමටත්, සමූහ කටයුතු හුරු කිරීමටත් සෑම ළමා නිවාසයකම ළමුන් කණ්ඩායම් වශයෙන් බෙදාගෙන තිබිය යුතු ය.

7.9 ළමා නිවාස යහපත් පාලනයකින් තොරව, ළමයින්ට අහිතකර ලෙස පවත්වනු ලබන විට ඒ පිළිබඳව දැඩි ක්‍රියාමාර්ගයක් ගැනීමට දෙපාර්තමේන්තුවට සිදුවේ. එවැනි අසතුටුදායක තත්ත්වයක් පවතින විට, යථා පරිදි තත්ත්වයට නංවා ගන්නා ලෙසට දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන දැන්වීම පරිදි එසේ තත්වය දියුණු කර ගැනීමට කටයුතු නොකරන්නේ නම් එම නිවාස වසා දමා ළමයින් වෙනත් නිවාසවලට මාරු කිරීමට නීතිමය ක්‍රියාමාර්ගයක් අනත්දරු නිවාස ආඥාපනත යටතේ ගැනීමට දෙපාර්තමේන්තුවට සිදු වේ.

*ඇමුණුම - 02*

| *වෘත්තීය අභ්‍යාස මධ්‍යස්ථානයේ නම* | *ලිපිනය* |
|---|---|
| එස්. ඕ. ළමා ගම්මානය | තැ.පෙ. 01, කුමාරවත්ත, මොණරාගල. |

06-337/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.